වාර්ෂික වාර්තාව
ஆண்டறிக்கை
ANNUAL REPORT

2023

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
இலங்கை தேசிய திரைப்படக் கூட்டுத்தாபனம்
THE NATIONAL FILM CORPORATION OF SRI LANKA

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

වාර්ෂික වාර්තාව
2023

<u>පිළිගැන්වීම</u>

දිනය - 2024.06.20

මගේ අංක NFC/119/02/01/01 - 2023

ලේකම්
ජනමාධ්‍ය අමාත්‍යාංශය මගින්,

ආචාර්ය බන්දුල ගුණවර්ධන මැතිතුමා
ජනමාධ්‍ය අමාත්‍යාංශය,
163, "ඇසිදිසි මැදුර",
කිරුළපන මාවත,
පොල්හේන්ගොඩ,
කොළඹ 05.

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
වාර්ෂික වාර්තාව - 2023

1980 අංක 45 දරන පනතින් සංශෝධිත 1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 32 (1) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (1) වගන්තිය ප්‍රකාරව 2023 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා පහත සඳහන් ලේඛන ද සමග සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

1. 2023 වසරේ සංස්ථාව විසින් කරන ලද කාර්යයන් හා අදාළ ප්‍රකාශ
2. 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා සංස්ථාවේ ලාභලාභ ගිණුම්, ආශ්‍රිත සටහන් හා එදිනට ශේෂ පත්‍රය
3. 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා විගණකාධිපති වාර්තාව

මෙයට විශ්වාසී වූ,

රවි ප්‍රසාද් කලුපහන
සාමාන්‍යාධිකාරී
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

අත්සන් කළේ - නිතිඥ දීපාල් චන්ද්‍රරත්න
සභාපති
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

පාලන වාර්තාව

01. හැඳින්වීම
02. අධ්‍යක්ෂ මණ්ඩලය
03. මානව සම්පත් හා පරිපාලන කටයුතු
04. දේශීය චිත්‍රපට නිෂ්පාදනය, චිත්‍රපට ප්‍රචාරණය/ සිනේ ඇඩ්ස්
05. සිනමා සංස්කෘතිය හා අධ්‍යාපන කටයුතු
06. චිත්‍රපට ප්‍රදර්ශනය
07. දේශීය සැපයුම් - ආනයන හා අපනයන
08. විගණන කටයුතු
09. මූල්‍ය කටයුතු
10. නෛතික කටයුතු
11. චිත්‍රාගාරය
12. විමර්ශන කටයුතු
13. සැලසුම් සංඛ්‍යාලේඛන හා පුහුණු
14. වෛද්‍යාධාර
15. සුබසාධනය
16. ආගමික කටයුතු
17. වෘත්තීය සමිති
18. ස්තූතිය

01. හැඳින්වීම

1980 අංක 45 දරන පනතින් සංශෝධනය කළ 1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 32 (1) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (1) වගන්තිය යටතේ ජනමාධ්‍ය අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන මැතිතුමා හා විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලබන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ 2023 වර්ෂය පිළිබඳ වාර්තාව.

2023 වර්ෂය පිළිබඳ ඉදිරිපත් කරන මෙම වාර්තාව ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ 51 වන ක්‍රියාත්මක වර්ෂයට අදාළ වේ.

02. අධ්‍යක්ෂ මණ්ඩලය

2023 වර්ෂය තුළ ජාතික චිත්‍රපට සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලය පහත නම් සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විතව ඇත.

	නම	තනතුර
01.	නීතිඥ දීපාල් චන්ද්‍රරත්න මහතා	සභාපති ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
02.	දිනිත් චින්තක කරුණාරත්න මහතා	රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (නිල බලයෙන්)
03.	භාග්‍යා සී.කටුදෙනිය මිය (2023.02.28 – 2023.07.15)	සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂක, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (නිල බලයෙන්)
	වයි. අයි. ඩී. ගුණවර්ධන මිය (2023.08.29 – 2023.12.31)	
04.	නලින් කුමාර නිශ්ශංක මහතා (2022.08.10 – 2023.10.31)	අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (නිල බලයෙන්)
	පී. යූ. ටී. වරුසවිතාන මිය (2023.11.21 – 2023.12.31)	
05.	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සමන්ත හේරත්	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (විශ්ව විද්‍යාල නියෝජනය)
06.	ආචාර්ය උදිත ගුණසේකර	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (විශ්ව විද්‍යාල නියෝජනය)
07.	ජනාධිපති නීතිඥ ජගත් වික්‍රමනායක මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
08.	ඈෂ්ලි රත්නවිභූෂණ මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (සිනමා කර්මාන්තය)

09.	සන්ධ්‍යා දර්ශනී ගුණසේකර මිය (නදීකා ගුණසේකර)	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (සිනමා කර්මාන්තය)
10.	පී. පී. එස්. ආර්. ද සිල්වා මහතා (2022.11.19 – 2023.09.18)	අධ්‍යක්ෂ, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව. භාණ්ඩාගාර නියෝජිත
	ඩී. පී. ජී. ප්‍රදීප් මහතා (2023.09.18 – 2023.12.31)	අධ්‍යක්ෂ තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව භාණ්ඩාගාර නියෝජිත

03. මානව සම්පත් හා පරිපාලන කටයුතු

2023 වර්ෂයේ සංස්ථා කාර්ය මණ්ඩලය

2023.01.01 දිනට කාර්ය මණ්ඩලය	
අනුමත සංඛ්‍යාව	186
ස්ථිර සංඛ්‍යාව	114
2023 වර්ෂය තුළ ඉවත් වූ සංඛ්‍යාව	
විශ්‍රාම ලැබූ සේවක සංඛ්‍යාව	04
සේවයෙන් ඉල්ලා අස්වූ සේවක සංඛ්‍යාව	04
සේවයෙන් පහ කිරීම	01
2023.12.31 ස්ථිර කාර්ය මණ්ඩලය	105
අනෙකුත් කාර්ය මණ්ඩලය	
සභාපති	01
2023.12.31 මුළු කාර්ය මණ්ඩලය	**106**

ආයතන පාලනය හා සේවක අවශ්‍යතා ඉටුකිරීම

ආයතනයේ සේවක පාලනයට අදාළව අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග ඉදිරියට ගෙනයමින් සේවා කටයුතු ඉටුකර ඇත.

04. දේශීය චිත්‍රපට නිෂ්පාදනය, චිත්‍රපට ප්‍රචාරණය/ සිනේ ඇඩ්

වැඩසටහන	ක්‍රියාකාරකම	2023.01.01 සිට 2023.12.31 දක්වා මුල්‍ය ආදායම් ප්‍රගතිය (රු)	එකතුව (රු)
දේශීය චිත්‍රපට ලියාපදිංචි කිරීම	ලියාපදිංචි ලිපි නිකුත් කිරීම	71	
		355,000.00	355,000.00
විදේශ තිර පිටපත් හා කතා සාරාංශ සඳහා අනුමැතිය	තිර පිටපත්	15	
		142,500.00	
	කතා සාරාංශ	42	
		210,000.00	352,500.00
විදේශ රූගත කිරීම් සඳහා අනුමැතිය	වෘතාන්ත චිත්‍රපට	3	
		874,500.00	
	වාර්තා වැඩ සටහන්	31	
		1,514,000.00	
	කෙටි චිත්‍රපට	1	
		112,000.00	
	ටෙලි කතා මාලා	2	
		374,500.00	
	රියැලිටි වැඩසටහන්	3	
		668,000.00	
	චාරිකා,සංචාරක හා ජීවන රටා වැඩසටහන් සහ චිත්‍රපට ගීත	8	
		540,000.00	
	වෙළඳ දැන්වීම්	1	
		87,000.00	4,170,000.00
විදේශ චිත්‍රපට ආනයනය	චිත්‍රපට ආනයන බලපත්‍ර ලිපි නිකුත් කිරීම	146	
		1,460,000.00	
	ආනයනකරුවන් ලියාපදිංචි කිරීම	20	
		1,000,000.00	2,460,000.00
දැන්වීම් ප්‍රචාරණය	සිංහල චිත්‍රපට පුවත්පත් ප්‍රචාරක කටයුතු	2	
		20,123.20	
	චිත්‍රපට ප්‍රචාරක පුවරු ප්‍රදර්ශනය කිරීම්	53	
		594,000.00	614,123.20
සිනමා ශිල්පී වෘත්තීය හැඳුනුම්පත් මුද්‍රණය	හැඳුනුම්පත් මුද්‍රණය හා නිකුත් කිරීම	45	
		22,500.00	22,500.00
මුළු එකතුව			7,974,123.20

වැඩසටහන	ක්‍රියාකාරකම	එකතුව (රු)
සිනමා ශිල්පී සුභ සාධනය හා ඇගයීම	රංගන ශිල්පීන්,කාර්මික ශිල්පීන් සඳහා මරණාධාර ගෙවීම්	**300,000.00**
	වෛද්‍යාධාර ගෙවීම්	**90,000.00**
	නිර්මාණ ප්‍රවර්ධනය	**50,000.00**
	චිත්‍රපට කලාකරුවන් හා කාර්මික ශිල්පීන් සඳහා විශ්‍රාම වැටුප් ගෙවීම. (සිනමා කලාකරුවන් 150 දෙනෙකු සඳහා මාසිකව රු.5,000.00 බැගින් ගෙවීමක් සිදු කරන ලදි.)	**9,000,000.00**

ප්‍රචාරක වියදම් සාරාංශය

	ගෙවන ලද ආයතනය	පුවත්පත් දැන්වීම විස්තරය	මුදල (රු.)
1	එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම (Lake House)	ආරක්ෂක සේවා සැපයීම - 2022/2023	122,930.40
2	එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම (Lake House)	ආනයනකරුවන් ලියාපදිංචි කිරීම - 2023	85,120.70
3	එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම (Lake House)	චිත්‍රපට තිර රචනය	13,196.25
4	එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම (Lake House)	NFC/BID/S/2023-3(LOI)	136,850.00
5	එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම (Lake House)	සනීපාරක්ෂක සේවා සැපයීම - 2023/2024	120,428.00
6	එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම (Lake House)	ආරක්ෂක සේවා සැපයීම - 2024/2025	120,428.00
7	විජය පුවත්පත් සමාගම	ලොක්ඩවුන් පුවත්පත් දැන්වීම	22,943.88
8	විජය පුවත්පත් සමාගම	රහස් කියන කඳු පුවත්පත් දැන්වීම	28,152.00
9	විජය පුවත්පත් සමාගම	රහස් කියන කඳු පුවත්පත් දැන්වීම	7,038.00
10	එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම (Lake House)	ප්‍රසම්පාදන දැන්වීම	148,384.50
11	එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම (Lake House)	සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2024	233,583.40
12	එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම (Lake House)	ආනයනකරුවන් ලියාපදිංචි කිරීම - 2024	85,120.70
	එකතුව		**1,124,175.83**

05. අධ්‍යාපන ප්‍රවර්ධන හා සංස්කෘතික

සිනමාකරණ ඩිප්ලෝමා පාඨමාලාව - 2023

සිනමාකරණ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සුදුස්සන් තෝරාගැනීමෙන් පසු 2023.01.28 දින සිට අධ්‍යයන කටයුතු ආරම්භකර ඇති අතර, පාඨමාලාවේ අධ්‍යයන කටයුතු අවසන් අදියරයට පැමිණ ඇත. කැමරාකරණ විෂය පිළිබඳ මසක කාලයක් අධ්‍යයන කටයුතු සිදුකළ යුතුව ඇත. පාඨමාලාවේ ආදායම රු. 2,970,000.00කි.

සිනමාකරණ ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය

2021 වර්ෂයේ සිනමාකරණ ඩිප්ලෝමා පාඨමාලාව සාර්ථකව හදාරා නිම කල සිසුන් සඳහා 2023.06.02 දින ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය උත්සවාකාරයෙන් සිදුකර ඇත.

චිත්‍රපට තිර රචනය - සහතික පත්‍ර පාඨමාලාව

පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවා ඇති අතර, අයදුම්පත් 25 ක් ලැබී ඇත. අයදුම්කරුවන්ගේ වැඩි ඉල්ලීම සති අන්ත දිනවල පාඨමාලාව පැවැත්වීමටයි. ඒ සඳහා ගබඩා ගොඩනැගිල්ල සකසන තෙක් සිනමා පුස්තකාලය පැවැත්වෙන ස්ථානයේ පාඨමාලාව ආරම්භ කිරීමට සැලසුම් කරමින් පවතී.

සිනමා රසවින්දන වැඩසටහන්

1. 2023.05.12 කොස්වත්ත මහා විද්‍යාලය, බණ්ඩාර කොස්වත්ත සිනමා රසවින්දන වැඩමුළුව.
2. 2023.05.12 කටුපොත පොලිස් ස්ථානය කේන්ද්‍ර කර ගනිමින් සිනමා රසවින්දන වැඩමුළුව.
3. කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කේන්ද්‍ර කර ගනිමින් අධ්‍යාපනික චිත්‍රපටයක් ප්‍රදර්ශනය කිරීම.
4. රත්නපුර සීවලී මධ්‍ය විද්‍යාලය විසින් සිදුකරන ලද චිත්‍රපටයන ගීත දෙකක් එළිදැක්වීමේ උත්සවයට සමගාමීව සිනමා රසවින්දන වැඩමුළුවක් පැවැත්වීම 2023.10.21
5. කොළඹ විශ්ව විද්‍යාලය, ශාස්ත්‍ර පීඨය සිනමා රසවින්දන වැඩමුළුව 2023.11.20
6. 2023.12.04 සිනමා රසවින්දන වැඩමුළුව සාරිපුත්ත ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය - දඹදෙණිය
7. 2023.12.05 සිනමා රසවින්දන මැඩමුළුව කුලි කටුමුළුව -කණිෂ්ඨ විද්‍යාලය - කටුමුළුව
8. 2023.12.15 සිනමා රසවින්දන වැඩමුළුව ශාන්ත ඇලෝසියස් විද්‍යාලය -රත්නපුර

ප්‍රකාශන අලෙවි කටයුතු

සංස්ථා සිනමා ශාලාවේ පැවැත්වෙන සිනමා කතිකා වැඩසටහන්වලට සමගාමීව සිනමා ප්‍රකාශන අලෙවි කිරීමට කටයුතු සිදු කිරීම.

චිත්‍රපට සංස්ථාව ඉදිරිපිට අලුතින් ස්ථාපනය කරන ලද අලෙවිසැලේ ප්‍රකාශන අලෙවිය සඳහා කටයුතු යෙදීම.

කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයට සමගාමීව සරසවි, නයින්පබ්ලිෂ් ආයතන වෙත සිනමා ප්‍රකාශන අලෙවි කටයුතු සඳහා යොමු කිරීම.

2023.12.31 දිනට ප්‍රකාශන අලෙවියෙන් ලබා ඇති ආදායම **රු.223,063 /=**

චිත්‍රපට සඟරාව

2023 චිත්‍රපට සඟරාව පළමු, දෙවන කලාප මුද්‍රණයෙන් නිකුත් වී ඇති අතර, සඟරා අලෙවිය සඳහා පොත්සල් වෙත යොමු කර ඇත.

සිනමා පුස්තකාලය

2023 ක්‍රියාකාරී සැලැස්ම යටතේ වෙන් කර ඇති ප්‍රතිපාද මගින් සිනමාව හා සම්බන්ධ පුස්තකාලය යාවත්කාලීන කර ඇත. නව ග්‍රන්ථ මිලදී ගැනීම සහ නව කබඩ් ලබාගැනීමට සහ පුළුල් කිරීමට කටයුතු යෙදීම.

සිනමා ප්‍රකාශන



2023 ක්‍රියාකාරී සැලැස්මට අනුව සිනමා ග්‍රන්ථ ප්‍රකාශන ව්‍යාපෘතිය යටතේ සිනමා ග්‍රන්ථ ජනගත කිරීමේ අරමුණින් කැඳවා ඇති අත්පිටපත් විද්වත් මණ්ඩලය වෙත පරීක්ෂාව සඳහා යොමු කර වාර්තා ලබාගෙන ඇත.

විමුක්ති ජයසුන්දර මහතාගේ අහසින් වැටෙයි චිත්‍රපටය සඳහා දීප්ති කුමාර ගුණරත්න මහතා විසින් සම්පාදනය කරන ලද "විමුක්තිගේ පැතලි යථාර්ථය" ග්‍රන්ථය 2023.09.21 දින ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයට සමගාමීව සංස්ථා ප්‍රකාශනයක් ලෙස ජනගත කිරීමට කටයුතු කිරීම.

සිනමා කතිකාව

1.2023.03.16 දින එච්. ඩී. ප්‍රේමරත්නයන්ගේ මැද මාවතේ සිනමාව මැයෙන් සිනමා කතිකා වැඩසටහනක් සංස්ථා සිනමා ශාලාවේදී සාර්ථක අයුරින් පැවැත්වීමට කටයුතු කිරීම.

2.2023.09.21 දින විමුක්ති ජයසුන්දරගේ අහසින් වැටෙයි චිත්‍රපටය එළිදැක්වීමට සමගාමීව සිදුකරන ලද විමුක්තිගේ පැතලි යථාර්ථය ග්‍රන්ථය ජනගතකිරීමත් සමග සිනමා කතිකා වැඩසටහනක් පැවැත්වීමට කටයුතු කිරීම.

3.2023.11.16 වන දින මිනරෙට්ස් නාද සංඥා වාර්තා චිත්‍රපටය, ප්‍රදර්ශනය, විචාර කෘතිය එළිදැක්වීම හා සිනමා කතිකාව වැඩසටහනක් පැවැත්වීම.

4.සිනමාකරණ ඩිප්ලෝමා පාඨමාලාවේ ආදි ශිෂ්‍යයින් විසින් සංවිධානය කරන මාසික සිනමා කතිකාව වැඩසටහන.

2023.10.21	විචාරය - විදර්ශන කන්නන්ගර	
2023.11.25	විචාරය - දීප්ති කුමාර ගුණරත්න	
2023.12.23	විචාරය - චින්තන ධර්මදාස	

සිනමා පාසල වැඩි දියුණු කිරීම

සිනමා පාසල වැඩි දියුණු කිරීම සඳහා 2024 වර්ෂය සඳහා ව්‍යාපෘති වාර්තාව සකස් කර අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.

NVQ VI යටතේ පාඨමාලා වැඩිදියුණු කිරීමට කටයුතු සිදු කරමින් පවතී.

ලෙස්ටර් සුමිත්‍රා අනුස්මරණ ජාතික තරුණ කෙටි චිත්‍රපට උළෙල සම්මාන උළෙල පැවැත්වීමට අදාල කටයුතු සිදුකිරීම.

06. චිත්‍රපට බෙදාහැරීම්

1. චිත්‍රපට ප්‍රදර්ශනය

- ❖ 2023 වර්ෂය තුළදී රිත්මා මණ්ඩලය යටතේ සිනමාශාලා 45ක් ක්‍රියාත්මක විය.

2. චිත්‍රපට මුදාහැරීම

- ❖ සිනමාශාලා 45ක් සඳහා රිත්මා මණ්ඩලය මගින් චිත්‍රපට මුදාහැර ඇත.
- ❖ සංස්ථා (රිත්මා) මණ්ඩලය යටතේ නව සිනමාශාලාවක් වශයෙන් පාලවිය - රමෝගා සිනමා ශාලාව විවෘත කර ඇති අතර, තාවකාලිකව වසා තිබූ හසලක සිනමා ශාලාව හා මැල්සිරිපුර - සමනල සිනමාශාලාව නැවත විවෘත කර චිත්‍රපට ප්‍රදර්ශනය ආරම්භ කර ඇත.
- ❖ 2023 වර්ෂය තුළ රිත්මා මණ්ඩලය හා අනෙකුත් මණ්ඩල සමග ඒකාබද්ධවී චිත්‍රපට මුදාහැරීමට කටයුතු කර ඇත.
- ❖ රිත්මා මණ්ඩලය මගින් සිංහල චිත්‍රපට 09ක් හා එක් දේශීය දමිළ චිත්‍රපටයක් මුදාහැරීමට කටයුතු කර ඇත.
- ❖ මෙම වර්ෂයේ ජනවාරි සිට සැපයුම්කරුවන් විසින් ආනයනය කරන ලද දමිළ චිත්‍රපට 09ක් හා හින්දි චිත්‍රපට 03ක් වාර්තාමය චිත්‍රපට 02ක් රිත්මා මණ්ඩලයේ හා අනෙකුත් මණ්ඩල සිනමාශාලා හා ඒකාබද්ධ වී රිත්මා මණ්ඩලය මගින් මුදාහැරීමට කටයුතු කර ඇත.
(සංස්ථා මණ්ඩලය වෙත ලබාදී ඇති කොටසින් (කෝටා) චිත්‍රපට ලබාගෙන රිත්මා මණ්ඩලය මගින් මුදාහැරීමට කටයුතු කර ඇත.)

3. චිත්‍රපට කුලිය

රිත්මා මණ්ඩලය විසින් අනෙකුත් මණ්ඩලවලට සපයන ලද චිත්‍රපට සඳහා ලැබී ඇති චිත්‍රපට කුලි මුදල්

❖	ලංකා ෆිල්ම්ස් ඩිස්ට්‍රිබියුටර්ස් කම්පැනි (පුද්) සමාගම	= රු. 4,185,557.81
❖	ඊ.ඒ.පී.ෆිල්ම්ස් ඇන්ඩ් ඉම්පෝටර්ස් (පුද්) සමාගම	= රු. 34,214,002.56
❖	සිනමා එන්ටර්ටේන්මන්ට් (පුද්) සමාගම	= රු. 2,056,091.00
❖	මුවි ප්‍රොඩියුසර්ස් ඇන්ඩ් ඉම්පෝටර්ස් (පුද්) සමාගම	= රු. 785,975.83

රිත්මා මණ්ඩලයේ සිනමා ශාලාවල අනෙකුත් මණ්ඩලවලින් ලබාගත චිත්‍රපට සඳහා පහත සඳහන් පරිදි මුදල් ගෙවා ඇත.

- ලංකා පිල්ම්ස් ඩිස්ට්‍රිබියුටර්ස් කම්පැනි (පුද්) සමාගම = රු. 25,941,172.10
- ඊ.ඒ.පී.ෆිල්ම්ස් ඇන්ඩ් ඉම්පෝටර්ස් (පුද්) සමාගම = රු. 34,729,632.29
- සිනමා එන්ටර්ටේන්මන්ට් (පුද්) සමාගම = රු. 7,625,890.10
- මූවි ප්‍රොඩියුසර්ස් ඇන්ඩ් ඉම්පෝටර්ස් (පුද්) සමාගම = රු. 6,977,432.36

07. දේශීය සැපයුම් ආනයනය හා අපනයනය

1. ප්‍රධාන කාර්යාලය සහ සරසවි චිත්‍රාගාරයට අදාළව සියලුම මුද්‍රණ කාර්යයන් සහ ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම් සිදු කිරීම. (ප්‍රවේශපත්‍ර මුද්‍රණය, සඟරා මුද්‍රණය ආදිය)
2. කාර්යාලීය ගෘහභාණ්ඩ මිලදී ගැනීමට අදාළව ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීම.
3. සංස්ථා වාහන සඳහා අවශ්‍ය ටයර් හා බැටරි මිලදී ගැනීමට අදාළ ප්‍රසම්පාද කටයුතු සිදු කිරීම
4. ප්‍රධාන කාර්යාලය සහ සරසවි චිත්‍රාගාරයට අදාළව සේවකයින් සඳහා අවශ්‍ය නිල ඇඳුම් මිලදී ගැනීමට අදාළ ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීම.
5. ප්‍රධාන කාර්යාලය සහ සරසවි චිත්‍රාගාරයට අදාළව සියලුම කාර්යාලී උපකරණ විදුලි උපකරණ හා යාන්ත්‍රික උපකරණ මිලදී ගැනීමට අදාළ ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම.
6. ප්‍රධාන කාර්යාලය සහ සරසවි චිත්‍රාගාරයට අදාළව ආරක්ෂක සේවා හා සනීපාරක්ෂක සේවා ලබා ගැනීමට අදාළ ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම.
7. ප්‍රධාන කාර්යාලය සහ සරසවි චිත්‍රාගාරයට අදාළව සියලුම යාන්ත්‍රික උපකරණ නඩත්තු, අළුත්වැඩියා හා සේවාකරණ කටයුතු හා ගිවිසුම් ගත වීමට අදාළ ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම.
8. සංස්ථා සියලුම වාහන නඩත්තු, අළුත්වැඩියා, සේවාකරණ කටයුතු හා වාහන රක්ෂණයට අදාළ ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම.
9. සංස්ථා සැමරුම් දින උත්සවයට අදාළ සියලුම ප්‍රසම්පාදන කාර්යයන් සිදු කිරීම.
10. ජනාධිපති සම්මාන උළෙල 2023 ට අදාළ සියලුම් ප්‍රසම්පාදන කාර්යයන් සිදු කිරීම.
11. සංස්ථාවේ අවශ්‍යතාවයන් වෙන්වෙන් සංග්‍රහ කටයුතු සඳහා අදාළ ප්‍රසම්පාදන කාර්යයන් සිදු කිරීම.
12. තරංගනී සිනමා ශාලාව අළුත්වැඩියා කිරීමට අදාළව පුවත්පත් දැන්වීමක් මගින් මිල ගණන් කැඳවා ලංසු විවෘත කර ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇත.
13. සංස්ථා වෙබ් අඩවිය සකස් කිරීමට අදාළව ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇත.
14. සංස්ථාවේ නඩත්තු කාර්යයන් සඳහා අවශ්‍ය සියලුම භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම.
15. 4K ප්‍රක්ෂේපණ යන්ත්‍රය අළුත්වැඩියා කිරීමට අදාළ ප්‍රසම්පාදන කාර්යයන් සිදු කිරීම.
16. 2024 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමට අදාළව පුවත්පත් දැන්වීම් පල කිරීම.
17. සිදු කරමින් පවතින E-Ticketing ව්‍යාපෘතියට අදාළ කටයුතු සිදු කිරීම.

08. අභ්‍යන්තර විගණන කටයුතු

1971 අංක 18 දරන පනත සහ සංශෝධිත පනතේ අරමුණු ළගාකරගැනීම සඳහා සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්මට අනුව 2023 වාර්ෂික අභ්‍යන්තර විගණන වැඩසටහන විගණකාධිපතිගේ උපදෙස් පරිදි සකස් කරන ලදී.

වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 03ක් පවත්වා ඇත.

2023.04.21
2023.07.21
2023.12.06

විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයින් 2023.04.21 සහ 2023.07.21

නම	තනතුර
පී. පී. එස්. ආර්. ද සිල්වා මහතා	කමිටු සභාපති (භාණ්ඩාගාර නියෝජිත)
නලින් කුමාර නිශ්ශංක මහතා	කමිටු සාමාජික
නදීකා ගුණසේකර මහත්මිය	කමිටු සාමාජික
ආර්. එම්. ජේ. රස්නායක මහතා	විගණන අධිකාරී - ජාතික විගණන කාර්යාලය
සී. ඩී. ජයසූරිය මහත්මිය	වැ. බ. අභ්‍යන්තර විගණක -ජනමාධ්‍ය අමාත්‍යාංශය

විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයින් 2023.12.06

නම	තනතුර
ඩී. පී. ජී. ප්‍රදීප් මහතා	කමිටු සභාපති (භාණ්ඩාගාර නියෝජිත)
නදීකා ගුණසේකර මහත්මිය	කමිටු සාමාජික
ආර්. එම්. ජේ. රස්නායක මහතා	විගණන අධිකාරී - ජාතික විගණන කාර්යාලය
සී. ඩී. ජයසූරිය මහත්මිය	වැ. බ. අභ්‍යන්තර විගණක -ජනමාධ්‍ය අමාත්‍යාංශය

09. මූල්‍ය කටයුතු

01. ආදායම් ප්‍රභවයන්

2022 - 2023 යන වර්ෂයන්හි සත්‍ය ආදායම හා 2023 වර්ෂයේ අයවැය ගත ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

ආදායම		2022 සත්‍ය රු. මි.	2023 සත්‍ය රු. මි.	අඩුවීම / වැඩි වීම (%)	2023 අයවැය රු. මි.
බෙදාහැරීමේ කොමිස්	- දේශීය	8.3	38.1	359	25
	විදේශීය	38.6	56.6	46.6	
සංස්ථාහාරය (වැඩිවීම)		6.6	9.2	39.3	3.5
අධිභාර පරීක්ෂණ දඩ මුදල් හා වෙනත්		1.5	2.7	80	1.5
සිනේඇඩ්ස් කොමිස්		0.01	0.02	100	0.1
චිත්‍රාගාරයේ ආදායම		2.5	4.6	84	2.5
වෙළඳ කටයුතු		1.8	2.9	61.1	2.7
මෙහෙයුම් ආදායම		**59.3**	**114.1**	**92.4**	**35.3**
වෙනත් ආදායම්		**91.9**	**141**	**53.4**	**87.7**
භාණ්ඩාගාරයෙන්	**-ජනාධිපති සම්මාන උළෙල**	**0**	**7.9**	**-**	**52**
	සඳහා පුනරාවර්තන වියදම් සඳහා ලැබීම්	**97.4**	**109.4**	**12.3**	**110**
මුළු ලැබීම්		**248.6**	**372.4**	**49.7**	**285**

2022 ට සාපේක්ෂව සලකා බැලීමේදී මෙහෙයුම් ආදායම 2023 දී 2022 ට වඩා 92.4% කින් වැඩි වීමක් පෙන්වා ඇත .දේශීය බෙදාහැරීමේ කොමිස් 359% කින් ද විදේශීය බෙදාහැරීමේ කොමිස් 46.6% කින් වැඩි වීම මෙහෙයුම් ආදායම වැඩි වීම හා වෙනත් ආදායම් 53.4%කින් වැඩිවීම මුළු ආදායම වැඩිවීමට හේතු වේ.

01. වියදම් ප්‍රභවය

2022, 2023 යන වර්ෂයන්හි සත්‍ය වියදම සහ 2023 වර්ෂයේ අයවැයගත වියදම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

වියදම	2022 සත්‍ය රු.මි.	2023 සත්‍ය රු.මි.	අඩුවීම/ වැඩි වීම(%)	2023 අයවැය රු.මි.
සේවක පාරිශ්‍රමික	88.8	103.9	17	98.1
ගමන් හා යැපීම් දීමනා	0.4	0.9	125	0.9
සැපයුම් හා උපකරණ	2.8	2.8	0	12.3
අළුත්වැඩියා කිරීම් හා නඩත්තු	4.7	11.4	142.5	11.3
ක්ෂයවීම්	27.1	26.9	(0.7)	19.3
ජාතික චිත්‍රපට උත්සව	35	35.6	1.7	59.6
විකුණුම් පිරිවැය	1.2	2.2	83.3	3
ප්‍රවාහන සම්බන්ධතා,අවශ්‍යතා වෙනත්	28.6	46.1	61.1	42.1
බොල් ණය වෙන් කිරීම්	19.4	0.06	(99.6)	0.5
පාරිතෝෂිත වෙන් කිරීම	2	1.9	(5)	2.5
චිත්‍රපට කලාකරුවන් හා කාර්මික ශිල්පීන්ගේ අරමුදල	8	10.3	28.7	-
මුළු වියදම	**218**	**242**	**11**	**249.6**

2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ දී වියදම 11% කින් වැඩි වී ඇත . සේවක වැටුප් වැඩිවීම මත සේවක පාරිශ්‍රමික වියදම 2022 වර්ෂයට වඩා 2023 වර්ෂයේදී 17% කින් වැඩිවීම මීට ප්‍රධාන හේතුව වී ඇත.

	2022	2023	%
මෙහෙයුම් ආදායම	59.3	114.1	92.5
අඩුකළා			
මෙහෙයුම් වියදම	(218)	(242)	11
මෙහෙයුම් ලාභය අලාභය /	(158.7)	(128)	(19.3)
එකතුකළා			
වෙනත් ආදායම්	91.9	141	53.4
වර්ෂයේ ලාභය අලාභය /	(66.8)	13	(119.4)
එකතුකළා			
භාණ්ඩාගාරයෙන් උළෙල සඳහා ජනාධිපති සම්මාන -	-	7.9	-
පුනරාවර්ථන වියදම් සඳහා	97.4	109.4	12.3
අතිරික්තය	30.6	130.3	325.8

2022 ට සාපේක්ෂව 2023 වර්ෂයේදී මෙහෙයුම් අලාභය 119.4% කින් අඩු වී ඇත. එනම් 2022 වර්ෂයේ දී මෙහෙයුම් අලාභයක් පැවතියද 2023 වර්ෂයේදී එය මෙහෙයුම් ලාභයක් බවට පත්ව ඇත.
තවද භාණ්ඩාගාරයෙන් පුනරාවර්තන වියදම් සඳහා ලැබීම් ද ගැලපීමෙන් පසු 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ 325.8% අතිරික්තයක් පෙන්වා ඇත.

02. ස්ථාවර වත්කම්

2023 වර්ෂයේදී සරසවි චිත්‍රාගාරයේ කාර්යාලය සඳහා පරිගණකයක් මිලදී ගැනීම සඳහා රු. 268,750 ක මුදලක් සහ සරසවි චිත්‍රාගාරයේ ශබ්ද අංශය සඳහා මල්ටිමීඩියා ප්‍රොජෙක්ටරයක් මිලදී ගැනීම සඳහා රු. මි. 1.6ක මුදලක්ද වැය කර ඇත. තවද සංස්ථා සිනමාශාලාවේ ප්‍රොජෙක්ටරය සඳහා P/B PCB Unit සහ Evc B PCB Unit මිලදී ගැනීම සඳහා රු.මි. 1.7ක මුදලක් ද, BAW ජයමාන්න මැදිරිය අලුත්වැඩියා කිරීම සඳහා රු. මි. 6.9 ක පමණ මුදලක් 2023 වර්ෂයේදී වැය කර ඇත.

03. ජංගම වත්කම්

පසුගිය වර්ෂයට සාපේක්ෂව සලකා බලනවිට ජංගම වත්කම් රු.මි. 409 කින් වැඩි වී ඇත.

04. ජංගම වගකීම්

2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේදී චිත්‍රපට කුලී ණයහිමියන් වැඩි වීම හේතුවෙන් රු. මි. 100 කින් ජංගම වගකීම් වැඩි වී ඇත.

10. නෛතික කටයුතු

2023 වර්ෂය තුල නීති අංශය මඟින් සිදු වී ඇති කාර්ය භාරය පහත පරිදි වේ.

- සංස්ථාව පාර්ශ්වයක් වන නඩු වලදී සංස්ථාව වෙනුවෙන් අදාල අධිකරණයේ සංස්ථාව වෙනුවෙන් සහභාගි වීම.
- කම්කරු විනිශ්චය සභා සහ කම්කරු දෙපාර්තමේන්තුව ඉදිරියේ කම්කරු ආරවුල් සඳහා සංස්ථාව වෙනුවෙන් පෙනී සිටීම.
- මානව හිමිකම් පැමිණිලි සඳහා මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරියේ සංස්ථාව වෙනුවෙන් පෙනී සිටීම.
- සියලුම නීත්‍යානුකූල ගිවිසුම් සකස් කිරීම සහ සම්පූර්ණ කරන ලද ගිවිසුම දෙපාර්ශවය අත්සන් තැබීමෙන් පසු අදාල අංශ වලට ලබා දීම.
    - ජනාධිපති සම්මාන උළෙල-2023
    - ලෙස්ටර්-සුමිත්‍රා ජාතික තරුණ කෙටි චිත්‍රපට උළෙල-2023 ව්‍යාපෘතිය
    - චිත්‍රපට බෙදාහැරීම
    - ආනයනය කරනු ලබන චිත්‍රපට
    - සංස්ථාවට උපකාරක සේවා ලබා ගැනීම, භාණ්ඩ මිලදී ගැනීම, ගොඩනැගිලි ඉදිකිරීම සහ වෙනත් කටයුතු සම්බන්ධයෙන්.
- එදිනෙදා අවශ්‍යතාවය පරිදි සංස්ථාවේ සියළුම අංශවලින් යොමු කරන නීතිමය ගැටළු සඳහා උපදෙස් ලබා දීම.

අධිකරණ කටයුතු

2023 වර්ෂය තුළ ක්‍රියාත්මක වෙමින් පැවති හා පවතින නඩු පිළිබඳ විස්තර

- අවසන් වූ අධිකරණමය නඩු

  - **අභියාචනාධිකරණ නඩු අංක: CA/Writ 308/2019**
    ලිබර්ටි සිනමාස් ඇතුළු පාර්ශවයන් 05 ක් විසින් චිත්‍රපට බෙදාහැරීමේ කාර්යය,පෞද්ගලික මණ්ඩල වලින් ඉවත් කිරීමට එරෙහිව මෙම නඩුව ගොනු කොට ඇත.විත්ති පාර්ශවයට වාසි සහගත ලෙස 2023-05-25 දින නිකුත් කරන ලදී.

  - **අභියාචනාධිකරණ නඩු අංක: CA/Writ 309/2019**
    සිනමා එන්ටර්ටෙන්ට්මන්ට් ආයතනය හා ලංකා පිල්ම් ඩිස්ට්‍රිබියුටර් ආයතනය විසින් චිත්‍රපට බෙදාහැරීමේ කාර්යය,පෞද්ගලික මණ්ඩල වලින් ඉවත් කිරීමට එරෙහිව මෙම නඩුව ගොනු කොට ඇත. විත්තියේ වාසියට තීන්දුව 2023-05-25 දින නිකුත් කරන ලදී.

  - **අභියාචනාධිකරණ නඩු අංක: CA/Writ 329/2019**
    මොහොමඩ් නසරුල්ලා මහතා ආයතනය විසින් චිත්‍රපට බෙදාහැරීමේ කාර්යය,පෞද්ගලික මණ්ඩල වලින් ඉවත් කිරීමට එරෙහිව මෙම නඩුව ගොනු කොට ඇත. විත්තියේ වාසියට තීන්දුව 2023-05-25 දින නිකුත් කරන ලදී.

  - **බස්නාහිර පළාත් බද මහාධිකරණ නඩු අංක: HCALT 25/2021**
    කම්කරු විනිශ්චය සභා නඩු අංක 13/41/2013 ලෙස ලියාපදිංචි වී තිබූ මෙම නඩුවෙන් ඉල්ලුම්කරුහට වාසි සහගත ලෙස කම්කරු විනිශ්චය සභා අධිකරණය විසින් නියෝගය ලබා දී තිබුණි. එම නියෝගයට එරෙහිව සංස්ථාව විසින් මෙම නඩුව ගොනු කොට ඇත.වග උත්තරකාර අභියාචක හට වාසි සහගත ලෙස තීන්දුව 2023-01-10 දින නිකුත් කරන ලදී.

  - **අභියාචනාධිකරණ නඩු අංක CA/Writ/570/2021**
    ස.සාමාන්‍යාධිකාරී-නීති නීතිඥ වත්සලා වික්‍රමආරච්චි මහත්මිය හට කිසිදු හේතු විමසීමකින් තොරව හා කිසිදු පරීක්ෂණයකින් තොරව අසාධාරණ ලෙස සහ අයුක්ති සහගත ලෙස වැඩ තහනම් කිරීමත් සහ තවත් කරුණු මුල් කරගනිමින් හිටපු සංස්ථා සභාපතිවරයා ඇතුළු 15 දෙනෙකු වග උත්තරකරුවන් කරමින් මෙම නඩුව ගොණු කරන ලදී. 2023-03-21 දින දෙපාර්ශවය විසින් ඇති කර ගත් එකගතාව මත සමථයකට එළඹෙන ලදී.

  - **මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක B-71120/05/22**
    පැමිණිලිකරුට හිමිපාරිතෝෂික දීමනා ගෙවීම් පැහැර හැරීමට එරෙහිව චිත්‍රපට සංස්ථාව වග උත්තරකරු කරමින් මැද කොළඹ කම්කරු දෙපාර්තමේන්තුව විසින් මෙම නඩුව ගොණු කරන ලදී.2023-02-21 අදාල මුදල් තැන්පත් කර නඩුව අවසන් කරන ලදී.

- අවසන් වූ කාර්මික අධිකරණ පැමිණිලි

  - **කාර්මික අධිකරණ බේරුම්කරණ අංක: A/11/2019**
    ජාතික චිත්‍රපට සංස්ථාව දෙනු ලබන වැඩ බැලීමේ දීමනාව ලබා ගැනීම සඳහා ඩී.ආර්.එස් පෙරේරා මිය විසින් කල පැමිණිල්ලකි. 2023.06.07 වන දින සමථයකට පත් වන ලදී.

  - **කම්කරු විනිශ්චය සභා නඩු අංක: 02/1138/2021**
    හිටපු ස.සාමාන්‍යාධිකාරී කිරණි පෙරේරා මිය විසින් ඇයගේ සේවය සමාප්ත කිරීමට එරෙහිව සහ තවත් කරුණු මුල් කර ගනිමින් පවරන ලද නඩුවක් වූ අතර මෙම පැමිණිලිකාරිය සමඟ සංස්ථාව සමථයකට එළඹුණු හෙයින් නඩුව අවසන් වන ලදී.

❖ <u>අවසන් වූ මානව හිමිකම් පැමිණිලි</u>

➢ **මානව හිමිකම් පැමිණිලි HRC/1334/20**
සභාකාර සාමාන්‍යාධිකාරී - නීති තනතුරෙන් අසාධාරණ ලෙස සහ අයුක්ති සහගත ලෙස වැඩ තහනමකට ලක්කිරීම සහ තවත් කරුණු මුල් කර ගනිමින් කරන ලද පැමිණිල්ලකි. පැමිණිල්ලේ ඉල්ලා ඇති සහන ලැබී ඇතිබව පැමිණිලිකරු දැන්වීම නිසා නඩුව 2023.05.04 දින අවසන් කරන ලදී.

❖ <u>දැනට විභාග වන නඩු කටයුතු</u>

➢ **සිවිල් අභියාචනාධිකරණ නඩු අංක: WP/HCCA/COL/114/2019/LA**
කොළඹ දිසා අධිකරණ නඩු අංක: DSP/99/2018 නඩුවේදී අතුරු ඉන්ජන්ෂන් නියෝගයක් ලබා දීම සඳහා කරන ලද ඉල්ලීම නිෂ්ප්‍රභා කිරීමට එරෙහිව අභියාචණය කිරීම

➢ **මාතර දිසා අධිකරණ නඩු අංක: DC-Pro 318**
මාතර "නිව් සිනමා" සිනමාශාලාව සම්බන්ධව පවතින බූදල් නඩුවේදී සංස්ථාවට අයවිමට ඇති සංස්ථා භාරය හා හිඟ චිත්‍රපට කුලිය ලබා ගැනීම සඳහා හිමිකම් පෑමට සංස්ථාව පාර්ශවයක් කර ඇත.

➢ **කොළඹ දිසා අධිකරණ නඩු අංක: DMR/2306/2013**
වලාපටල සිංහල චිත්‍රපටය නිශ්පාදනය සඳහා සංස්ථාවෙන් ලබා ගත් ණය මුදල් නොගෙවා පැහැර හැරීම.

➢ **කොළඹ දිසා අධිකරණ නඩු අංක: DMR/1126/2013**
සිනෙසිටි සිනමාශාලා 4 න් සංස්ථාවට අයවිය යුතු සංස්ථා භාරය නොගෙවීම.

➢ **කොළඹ දිසා අධිකරණ නඩු අංක: DSP/166/17**
කාල නැමැති චිත්‍රපටය ප්‍රදර්ශනයෙන් ඉවත් කිරීම වළක්වන වාරණ නියෝගයක් ලබා ගැනීම.

➢ **මහනුවර දිසා අධිකරණ නඩු අංක: DMR 607/2021**
චිත්‍රපට කුලිය හා භාරය නොගෙවීමට එරෙහිව අධිකරණමය ක්‍රියාමාර්ග ආරම්භ කිරීම

➢ **කොළඹ දිසා අධිකරණ නඩු අංක: DMR/729/20**
ජය ශ්‍රී ඇමතිතුමා චිත්‍රපටය ජාතික චිත්‍රපට සංස්ථාව සහ එයට අනුබද්ධිත සිනමාශාලාවල ප්‍රදර්ශනය නොකිරීම නිසා උක්ත චිත්‍රපට නිෂ්පාදක සහ අධ්‍යාක්ෂක හට සිදු වූ අලාභයන් අය කර ගැනීම වෙනුවෙනි.

➢ **මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක: B-27340/05/20**
සංස්ථා සේවකයින් වෙත ඉතිරිකර ගත් නිවාඩු සඳහා මුදල් ගෙවීම සම්බන්ධයෙන් නිකුත් කරන ලද අංක 3571/ඒ දරණ බේරුම්කරණ නියෝගය අනුව ප්‍රසිද්ධ කරන ලද අංක 2045/37 සහ 2017.11.16 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය ක්‍රියාත්මක නොකිරීම

➢ **කොළඹ දිසා අධිකරණ නඩු අංක: DSP 99/2018**
චිත්‍රපට බෙදාහැරීම සංස්ථාව යටතට පවරා ගැනීමට එරෙහිව වාරණ නියෝගයක් ලබා ගැනීම.

➢ **කොළඹ දිසා අධිකරණ නඩු අංක: DSP 156/2021**
ශ්‍රී ලංකා කැරම් සම්මේලනයේ නිලවරණය පැවැත්වීමට සියලු කටයුතු ක්‍රීඩා අමාත්‍යාංශය සූදානම් කර තිබියදී පැමිණිලිකරුවන් විසින් එය වළකාලමින් වාරණ නියෝගයක් ගෙන තිබුණි.

<u>දැනට විභාග වන කාර්මික අධිකරණමය පැමිණිලි</u>

- **බේරුම්කරණ අංක: A/70/2020**
  ඩබ්.ඒ.කුමාරසිරි ඇතුළු සේවකයින් 19 දෙනාට සේවා කාලයට ගැළපෙන සේ උසස්වීම් ක්‍රමවේදයක් ලබා නොදීම සහ අදාල වැටුප් පියවරේ නොතිබීම යන කරුණක් මුල්කරගනිමින් මෙම නඩුව ගොණු කර ඇත

- <u>දැනට විභාග වන මානව හිමිකම් පැමිණිලි</u>

- **HRC/172/20**
  හංවැල්ලේ පිහිටි ෆැමිලි සිනමා නම් සිනමා ශාලාවේ සියලු බඩු භාණ්ඩ හා උපකරණ විත්තිකාර ආයතනය විසින් කිසිදු අධිකරණ නියෝගයකින් තොරව පැහැර ගෙන යාමත් සහ තවත් කරුණු මුල් කර ගනිමින් මෙම පැමිණිල්ල ගොණු කරන ලදී.

- **HRC/695/20**
  ගෝත්‍රා නැමැති චිත්‍රපටය ප්‍රදර්ශනය සඳහා චිත්‍රපට සංස්ථාවෙන් යම් අසාධාරණයක් කරන ලදැයි ඒ සඳහාකරන ලද අසාධාරණය පිළිබඳ සහනයක් ලබා ගැනීමටපනවන ලදපැමිණිල්ලකි.

- **HRC/2804/19**
  පැමිණිලිකරු විසින් අධ්‍යක්ෂණය කරන ලද චිත්‍රපට වර්ගීකරණ කමිටුවෙන් ප්‍රතික්ෂේප කිරීමක් සහ තවත් කරුණු මුල් කර ගනිමින්සහ ඒවාට සාධාරණයක් අපේක්ෂා කරමින් මෙම පැමිණිල්ල ගොණු කරන ලදී.

- **HRC/614/20**
  ජාතික චිත්‍රපට සංස්ථාවේ ස.සාමාන්‍යාධිකාරී මුදල් (ගෙවීම්) ලෙස රාජකාරී කළ කිරණි පෙරේරා මියසේවයෙන් ඉවත් කිරීම සම්බන්ධයෙන් සහනයක් ලබා ගැනීම සඳහා ගොනුකරන ලද පැමිණිල්ලකි.

- **HRC/566/20**
  පැමිණිලිකරු චිත්‍රපට අධ්‍යක්ෂක වරයකි,ඔහු විසින් නිෂ්පාදනය සහ අධ්‍යක්ෂණය කල ලද "හීරෝවන්" චිත්‍රපටය එහි අධ්‍යක්ෂන කටයුතු අවසන් වූ පසු එම චිත්‍රපටය "වැඩ අපේ වෙඩි වගේ "නමින් වෙනස් විය.මෙම චිත්‍රපටය ප්‍රදර්ශනය කිරීමේ කටයුතු ප්‍රමාද වී ඇති බැවින් ඊට සහනයක් ලබා ගැනීම සඳහා ගොනුකරන ලද පැමිණිල්ලකි.

- **HRC/2571/19**
  ජය ශ්‍රී ඇමතිතුමා යන චිත්‍රපටය ප්‍රදර්ශනයට අවස්ථාව ලබා නොදීම නිසා සිදුවූ අලාභයට සහනයක් ලබා ගැනීම සඳහා ගොනුකරන ලද පැමිණිල්ලකි.

- **HRC/2754/19**
  චිත්‍රපටයන් සඳහා සංස්ථාව විසින් අසාධාරණ තීරණ ගැනීමක් ඒ පිළිබඳව අමාත්‍යාංශය වෙත සිදු කල අභියාචණා පවා නොසලකා හැරීමක් යන විවිධ වූ කරුණු කාරණා මුල් කරගනිමින් මෙම පැමිණිල්ල ගොණු කර තිබේ.

- **HRC/2888/15**
  අභිනිෂ්ක්‍රමනය යන චිත්‍රපටය සඳහා අදාල ණය මුදල් නොලැබීම යන කරුණු මත පැමිණිල්ල ගොණු කර තිබේ.

11. චිත්‍රාගාර සේවා සැපයීම

පශ්චාත් නිෂ්පාදන අදියරේ පවතින චිත්‍රපට සඳහා කාර්මික සේවාවන් සහ පහසුකම් සැපයීම දළුගම සරසවි චිත්‍රාගාරයේ ප්‍රධාන කාර්යභාරය වේ. මෙම වසරේදීත් චිත්‍රාගාරයේ පහත සඳහන් අංශ වලින් දේශීය චිත්‍රපට නිෂ්පාදකවරුන්ට අවශ්‍ය කාර්මික සේවාවන් සහ පහසුකම් සපයා ඇත.

1. ශබ්ද අංශය (Digital)
2. ආරේඛිය සංරක්ෂණ අංශය (Digital)
3. සංරක්ෂන අංශය (Analogue)
4. චිත්‍රපට සංරක්ෂණාගාරය
5. චිත්‍රපට හා රූපවාහිනි රූගත කිරීමේ මැදිරිය

<u>ශබ්ද අංශයේ සිදු කරන ලද නිර්මාණ</u>

1. Vesper කෙටි චිත්‍රපටය
2. Not a song to us කෙටි චිත්‍රපටය
3. ක්ෂීර සාගරය කැළඹිණි චිත්‍රපටය
4. සිංහබාහු චිත්‍රපටය
5. Cyanide චිත්‍රපටය
6. ඉක්කා චිත්‍රපටය
7. යාළුවෝද යාළුයිද චිත්‍රපටය
8. සඳ දිය සළු චිත්‍රපටය
9. Lost flyers කෙටි චිත්‍රපටය
10. සිහින සමීකරණ චිත්‍රපටය
11. Monkey Man චිත්‍රපටය
12. මොණරවිල චිත්‍රපටය
13. සිරුවෙන්
14. කදිර දිව්‍ය රාජ චිත්‍රපටය
15. අංගාර චිත්‍රපටය
16. On the Fly කෙටි චිත්‍රපටය
17. The Wackyකෙටි චිත්‍රපටය
18. මේක පුදුම කතාවක් චිත්‍රපටය
19. නුහුරු වැයම චිත්‍රපටය
20. රජ දහනචිත්‍රපටය
21. Beef කෙටි චිත්‍රපටය
22. Life bouy කෙටි චිත්‍රපටය
23. 1970 Love story
24. LB රන් ණය රූපවාහිනී වෙළඳ දැන්වීම
25. සුමිතුරු නළුවා චිත්‍රපටය
26. Teach me චිත්‍රපටය
27. Our mother, Garnd mother prime minister Sirimavo කෙටි චිත්‍රපටය
28. සාජන්ට් පුංචි සෝම චිත්‍රපටය
29. සීගිරි චිත්‍රපටය
30. වර්ණා චිත්‍රපටය
31. ඇගේ නම රති චිත්‍රපටය
32. මාගම් සෝලි චිත්‍රපටය
33. Ozone zone ගීතය
34. පැල්ම කෙටි චිත්‍රපටය
35. Distance කෙටි චිත්‍රපටය
36. Buffalo Travels චිත්‍රපටය
37. Canola රූපවාහිනී වෙළඳ දැන්වීම
38. ශ්‍රී වික්‍රම චිත්‍රපටය
39. Within the silence of sound කෙටි චිත්‍රපටය
40. නව දෙමෝදර පාලම චිත්‍රපටය
41. රතු අතු අග චිත්‍රපටය
42. සුරහනා චිත්‍රපටය
43. රිවර්ස්ටන් චිත්‍රපටය

<u>සංස්කරණ අංශය</u>

1. සුමිතුරු නළුවා චිත්‍රපටය
2. රේඛාව චිත්‍රපටය
3. සංදේශය චිත්‍රපටය
4. මේක පුදුම කතාවක් චිත්‍රපටය
5. වර්ණා චිත්‍රපටය
6. කඩතුරාව ටෙලි නාට්‍ය

7. අපායේ තත්පර 84000 චිත්‍රපටය
8. ඇල්ල ළඟ පෙම්වතියෝ චිත්‍රපටය
9. යකඩ දියණියෝ චිත්‍රපටය
10. සාජන්ට් පුංචිසෝම චිත්‍රපටය
11. නුහුරු වැයම චිත්‍රපටය
12. සඳ තාරකා චිත්‍රපටය
13. Buffalo Travels චිත්‍රපටය
14. සුරඟනා චිත්‍රපටය
15. හද ගැස්ම චිත්‍රපටය
16. නව දෙමෝදර පාලම චිත්‍රපටය

<u>රූගත කිරීම්</u>

1. ආසයි මං නටන්න - මුහුරත් උළෙල
2. තුඟු සිරස ගීතය
3. සඳ එක් දිනක් චිත්‍රපටය
4. සිත් යාය ටෙලි නාට්‍ය
5. Ritz bury Chunky choc රූපවාහිනී වෙළඳ දැන්වීම
6. New year celebration වැඩසටහන
7. සිඟිති අවුරුදු කුමරා කුමරිය වැඩසටහන
8. සුහද හමුව
9. Kuweni Live in concert වැඩසටහන
10. රාණි සබන් රූපවාහිනී වෙළඳ දැන්වීම
11. නාද ගම පුහුණු වීම
12. සංගීත වැඩසටහන් පුහුණුව
13. සිනමාකරණය සම්බන්ධ රූගත කිරීම් පාඩම
14. රතු අතු අග චිත්‍රපටය
15. සඳකඩ නර්තන වැඩසටහන පුහුණු වීම
16. නීති අධ්‍යාපනය සම්බන්ධ සාකච්ඡාමය වැඩසටහන

<u>චිත්‍රපට ප්‍රදර්ශනය</u>

1. මේක පුදුම කතාවක් චිත්‍රපටය
2. නුහුරු වැයමචිත්‍රපටය
3. තුන්පත් රෑන චිත්‍රපටය
4. රහස් කියන කඳු චිත්‍රපටය
5. Jobless Douglas චිත්‍රපටය
6. රිදී සීනු චිත්‍රපටය
7. රුවන් තාරකා චිත්‍රපටය

<u>ජූරිය වෙනුවෙන් චිත්‍රපට ප්‍රදර්ශණය</u>

1. Pay Grill - ලෙස්ටර් සුමිත්‍රා කෙටි චිත්‍රපට උළෙල
2. ජනාධිපති සිනමා සම්මාන උළෙල
3. සරසවි සිනමා සම්මාන උළෙල

<u>මීට අමතරව සිදු කරන ලද කාර්යයන්</u>

1. සරසවි චිත්‍රාගාරයේ අභිනවයෙන් ආරම්භ කරන ලද යූ ටියුබ් චැනලය සඳහා වාර්තා වැඩසටහනක් රූගත කිරීම සහ සකස් කිරීම.
2. චිත්‍රාගාරයේ ශබ්ද මිශ්‍රණ මැදිරිය චිත්‍රපට ප්‍රදර්ශණය සඳහා සුදුසු මැදිරියක් බවට වැඩි දියුණු කිරීම.
3. චිත්‍රාගාරයේ වර්ණ සංයෝජන මැදිරිය සහ සංස්කරණ මැදිරිය වැඩි දියුණු කර සකස් කිරීම.

12. විමර්ශන කටයුතු

2023 වර්ෂය තුළ විමර්ශන අංශය විසින් ඉටුකරන ලද කාර්යයන්

1. සිනමාශාලා පරික්ෂා කිරීම හා අක්‍රමිකතා සඳහා හරපත්‍ර නිකුත් කිරීම.
2. නව සිනමාශාලා විවෘත කිරීම හා වසා දමා තිබූ සිනමාශාලා නැවත විවෘත කිරීම.
3. විදේශ රූ ගත කිරීම් අධීක්ෂණය.
4. සිනමාශාලා සඳහා මත්පැන් පැන් බලපත්‍ර ලබාගැනීම සඳහා නිෂ්කාශන ලිපි නිකුත් කිරීම.
5. 2022.09. 27 දින පත්කරන ලද කමිටුව වෙත පවරන ලද සිනමාශාලාවලින් අයවිය යුතු පැරණි හිඟ මුදල් අයකර ගැනීම.

01. සිනමාශාලා පරික්ෂා කිරීම

පරික්ෂණ අංශයේ ප්‍රධාන කාර්ය වන්නේ සිනමාශාලා පරික්ෂා කිරීමයි. 2023 වර්ෂයේ පරික්ෂන වාර 1134කි.

02. සිනමාශාලා වල සිදුවන අක්‍රමිකතා සඳහා හරපත්‍ර නිකුත් කිරීම.

විමර්ශන නිලධාරින් විසින් සිනමාශාලා පරික්ෂා කිරීමේ දී අක්‍රමිකතා හඳුනාගෙන ඇත. ඒ සඳහා සංස්ථා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කරමින් 2023 වර්ෂය රු. 964,590.00ක වටිනාකමකින් යුක්ත හරපත්‍ර 42 ක් නිකුත් කර ඇත. ඉන් රු. 614,190.00 ක මුදලක් අයකරගෙන ඇත.

03.නව සිනමාශාලා විවෘත කිරීම හා වසා දමා තිබූ සිනමාශාලා නැවත විවෘත කිරීම.

වසා දමා තිබූ සිනමාශාලා නැවත විවෘත කිරීම.

01. වොක්ස් ලයිට් සිනමා - අවිස්සාවේල්ල
02. රිගල් - කටුබැද්ද
03. රිගල් - බණ්ඩාරවෙල
04. රමෝගා සිනමා - පාලවිය
05. රූ සිනමා - කටුනායක (නැවත විවෘත කිරීම)

04. විදේශ රූ ගත කිරීම් අධීක්ෂණය

විදේශ රට වලින් ශ්‍රී ලංකාවට පැමිණෙන වෙළඳ දැන්වීම්, චිත්‍රපට හා වාර්තාමයේ වැඩසටහන් රූගත කිරීම් අධික්ෂන කටයුතු සිදු කරන ලදී. ඒ අනුව 2023 වර්ෂයේ විදේශ රූ ගත කිරීම් වාර ගණන 47 ක් අධික්ෂණය කර ඇත.

05. සිනමාශාලා සඳහා මත්පැන් පැන් බලපත්‍ර ලබාගැනීම සඳහා නිෂ්කාශන ලිපි නිකුත් කිරීම.

නිකුත් කල බලපත්‍ර සංඛ්‍යාව 22

06. සිනමාශාලාවලින් අයවිය යුතු පැරණි හිග මුදල් අයකර ගැනිම

2022.09.27 දිනට සිනමාශාලාවලින් අයවිය යුතු පැරණි හිග මුදල් අයකර ගැනිම සඳහා විමර්ශන අංශයේ පත්කරන ලද කමිටුව මගින් 2023 වර්ෂය තුළ පහත පරිදි අයකර ගන්නා ලදි.

2022/12/31	රු.	5,652,080.73
ජනවාරි	රු.	8,019,285.82
පෙබරවාරි	රු.	934,729.93
මාර්තු	රු.	1,270,000.00
අප්‍රේල්	රු.	338,376.20
මැයි	රු.	1,008,204.29
ජූනි	රු.	4,150,929.15
ජූලි	රු.	868,000.00
අගෝස්තු	රු.	865,390.32
සැප්තැම්බර්	රු.	815,625.00
ඔක්තොම්බර්	රු.	625,000.00
නොවැම්බර්	රු.	844,413.12
දෙසැම්බර්	රු.	3,071,361.63
	රු.	**21,246,101.19**

13. සැලසුම්, සංඛ්‍යාලේඛන හා පුහුණු

මෙම අංශයේ ප්‍රමුඛ කාර්යභාරය පහත පරිදි වේ.



- ආයතනික සැලසුම් සකස් කිරීමේ අවශ්‍ය මාර්ගෝපදේශකත්වය සැපයීම.
- සංයුක්ත සැලසුම් සහ ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම හා ප්‍රගතිය අධීක්ෂණය
- වාර්ෂික වාර්තා පිළියෙල කිරීම
- මාසික සහ කාර්තුමය ප්‍රගතිය රේඛීය අමාත්‍යාංශය සහ අදාල ආයතන වෙත ඉදිරිපත් කිරීම.
- කාර්යමණ්ඩල පුහුණු අවශ්‍යතාවන් හඳුනාගැනීම හා වාර්ෂික පුහුණු සැලසුම් සකස් කිරීම.

2023 වර්ෂයේ පහත පුහුණු වැඩමුළු පවත්වන ලදි.

- 2023.06.20 දින Academy of new thinking වැඩමුළුව පැවැත්වීම.
- 2023.12.17 සහ 18 දින ඌව කළමනාකරණ සංවර්ධන ආයතනයේ බැහැරගත පුහුණු වැඩමුළුවක් පැවැත්වීම.

14. වෛද්‍ය සහනාධාර ක්‍රමය

සාමාජික මුදල් හා සංස්ථාවෙන් ප්‍රදානය කරනු ලබන මුදල් මත පවත්වාගෙන යනු ලබන වෛද්‍ය සහනාධාර ක්‍රමය මෙම වර්ෂය තුළ ද ක්‍රියාත්මක වූ අතර එහි පාලක කමිටුව පහත පරිදි වේ.

- දුනිල් හෙයියන්තුඩුව මහතා - වැ. බ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මුදල් (කමිටු සභාපති)
- ප්‍රදීප් ලංකා ධර්මවික්‍රම මහතා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මුදල් (කමිටු සභාපති) 2023.03.07 දින සිට
- අසංක ගුණතිලක මහතා - පරිපාලන නිලධාරී - පාලන හා මානව සම්පත්
- දුලිප් ප්‍රියාන් මහතා - ජාතික සේවක සංගමයේ නියෝජිත
- අයෝධ්‍යා නදිශානි මිය - චිත්‍රපට සංස්ථා සේවක සංගමයේ නියෝජිත

15. සුභසාධක සංගමය

සංස්ථා සුභසාධක සංගමය විසින් සමාලෝචිත වර්ෂයේ දී ඉටුකර ඇති සේවක සුබසාධන කටයුතු පහත පරිදි වේ.

- මරණාධාර දීමනාව සාමාජිකයින් වෙනුවෙන් 100,000/-ක් හා යැපෙන්නන් වෙනුවෙන් 50,000/- දක්වා වැඩිකිරීම.
- සේවයේ යෙදී සිටින විදෙස්ගත වූවන් වෙනුවෙන්ද මරණාධාර මුදල් අඩක් අනුමත කිරීම.
- වසර 15ක සේවා කාලයක් සහිත වූවන්ට ණය සඳහා ඇප අහෝසි කිරීම.
- 2022.12.05 දින සිට සංස්ථා ආපනශාලාව විවෘත කරවීම
- 2023.01.12 සිට මිල්කෝ කිරි අලෙවි සැලක් ආරම්භකිරීම
- සියළු සාමාජික ණය රුපියල් 20,000 සිට 25,000ක් දක්වා වැඩි කිරීම
- පැරණි කඩදාසි අලෙවිකර රුපියල් 25,000/- මුදලක් සංගමයට ලබාගැනීම.
- 2023.04.02 දින කාර්ය මණ්ඩලය සුහද චාරිකාවක් රැගෙන යාමට කටයුතු සංවිධානය කිරීම.
- පොත් බෙදාදීම වෙනුවෙන් බෞද්ධ සංගමයට රුපියල් 25,000/-ක් පරිත්‍යාග කිරීම.
- පළමු වරට අප්‍රේල් මස වැටුපෙන් සේවක ණය මුදලේ වාරිකය අයකර ගැනීම අත්හිටුවීමට තීරණය කිරීම.
- අවමංගල්‍ය අවස්ථාවට සහභාගිවීමේ දී වන ප්‍රවාහන කුලියෙන් 50%ක් ආයතනයෙන් ලබාගැනීමට කටයුතු කිරීම.
- අභාවප්‍රාප්ත සුමිත්‍රා පීරිස් මැතිණියගේ අවමංගල්‍ය වෙනුවෙන් සංස්ථාවට රැස්වූ කලාකරුවන් හට සංග්‍රහ කටයුතු සංගමයේ ප්‍රධානත්වයෙන් සිදුකිරීම.
- බෞද්ධ සංගමය විසින් සංවිධානය කරන කෝපි දන්සැල සඳහා රුපියල් 10,000/- පරිත්‍යාගයක් කිරීම.
- 2023.05.19 සිට සේවක යැපෙන්නන්ගේ අවමංගල්‍ය අවස්ථාවන් වෙනුවෙන් සංස්ථාවෙන් යොමුකරන මල් වඩමට වැය වන රු. 1500.00ට අමතර මුදල සංස්ථාවෙන් ලබාදීමට තීරණය කිරීම.
- 2023.07.20 දින අක්ෂි සායනයක් පවත්වා පහසු මිල ගෙවීම් ක්‍රමයට කණ්ණාඩි ලබාදීම.

- සිනමා ප්‍රකාශන අලෙවිසැල ආරම්භ කර ඉන් ලැබෙන මාසික කුලිය රු.25,000 සංගමයට ලබාගැනීම.
- 2023.12.29 දින සේවක සුහද හමුවක් පැවැත්වීම.

16. බෞද්ධ සංගමය

2023 වර්ෂයේදි අප සංගමයෙන් ඉටුකල කාර්ය භාරය පිළිබදව තොරතුරු පහත සදහන් වේ.

1. 2023.01.01 දින සංස්ථා සේවක මහත්ම මහත්මින් සදහා අශිර්වාද බොධි පූජා පිංකමක් සිදුකරන ලදි.
2. සංස්ථා සේවක මහත්ම මහත්මීන්ගේ අධ්‍යාපනය ලබන දූදරුවන් සඳහා අවශ්‍ය පොත්පත් ලබාදිම.
3. සමස්ථ ලංකා බෞද්ධ මහා සම්මේලනය මගින් පවත්වන ලද දේශන සඳහා සංස්ථා සේවක මහත්ම මහත්මීන් සහභාගි කරවිම.
4. සමස්ථ ලංකා බෞද්ධ මහා සම්මේලනය මගින් පවත්වන ලද සීල ව්‍යාපාරය සඳහා දහවල් දානය පිරිනැමීම.
5. පූජ්‍යපාද තලල්ලේ චන්ද්‍රකිත්ති ස්වාමින් වහන්සසේගේ ධර්ම දේශනයක් පවත්වා බෞද්ධ චිත්‍රපටයක් ප්‍රදර්ශනය කිරීම.
6. 2023 වෙසක් උත්සවය නිමිති කොටගෙන සංස්ථා පරිශ්‍රය සැරසිලි කිරීම, බිස්කට් හා කෝපි දන්සල පැවැත්වීම සහ බෞද්ධ චිත්‍රපට ගීත ප්‍රදර්ශනය කිරීම.

17. වෘත්තිය සමිති

ජාතික සේවක සංගමය, ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය, චිත්‍රපට සංස්ථා සේවක සංගමය හා වාණිජ කර්මාන්ත හා සේවා ප්‍රගතිශීලි සේවක සංගමය මෙම වසර තුළදී ද පාලන අධිකාරිය සමග සහයෝගයෙන් කටයුතු කර ඇත.

18. ස්තුතිය

2023 වසරේ සාර්ථක ප්‍රතිඵල ලබාගැනීම සඳහා සංස්ථා කාර්යමණ්ඩලය ඉතා වගකීමෙන් හා ධෛර්යයෙන් යුතුව සිය සේවාවන් ඉටුකර ඇත.

එම සේවාවන් අධ්‍යක්ෂ මණ්ඩලය ඉමහත් සේ අගය කරන අතර ඔවුන් වෙත සිය ස්තුතිය කෘතවේදිව පළකර සිටිමි.

රවි ප්‍රසාද් කළුපහන	අත්සන් කලේ - නිතීඥ දීපාල් චන්ද්‍රරත්න
සාමාන්‍යාධිකාරී	සභාපති
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව	ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

මූල්‍ය ප්‍රකාශන

2023

<u>ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව</u>

<u>**2023.12.31** දිනට අවසන් වර්ෂය සඳහා</u>

<u>විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය</u>

විස්තරය	සටහන		2023 රු.	2022 රු.
විකුණුම්	**03**		114,165,200	59,383,861
<u>අඩු කළා :</u> විකුණුම් පිරිවැය	**04**		(2,193,858)	(1,158,212)
දළ ලාභය			111,971,341	58,225,649
<u>අඩු කළා :</u> වියදම්				
සේවක පාරිශ්‍රමික	**05**		(103,854,869)	(88,750,498)
ගමන් හා යැපීම් දීමනා	**06**		(911,927)	(427,865)
සැපයුම් හා උපකරණ	**07**		(2,809,487)	(2,843,435)
අළුත්වැඩියා කිරීම් නඩත්තු හා ක්ෂයවීම්	**08**		(11,390,523)	(4,726,876)
ක්ෂයවීම්	**08A**		(26,927,756)	(27,141,801)
ප්‍රවාහන , සම්බන්ධතා , අවශ්‍යතා හා වෙනත් සේවා	**09**		(46,132,855)	(28,642,201)
2022 ජනාධිපති සිනමා උළෙල සඳහා වියදම්	**09A**		(25,602,578)	-
2023 ජනාධිපති සිනමා උළෙල සඳහා වෙන්කිරීම්	**09B**		(10,000,000)	(35,000,000)
අඩමාණ ණය වෙන්කිරීම්	**16-A**		(63,586)	(19,414,395)
පාරිතෝෂික වෙන් කිරීම්	**20**		(1,907,458)	(2,009,657)
චිත්‍රපට කලාකරුවන් හා කාර්මික ශිල්පීන්ගේ අරමුදල් සඳහා දායකත්වය			(10,280,000)	(8,000,000)
			(239,881,039)	(216,956,727)
මෙහෙයුම් ලාභය / අලාභය			(127,909,697)	(158,731,078)
<u>එකතු කළා :</u>				
වෙනත් ආදායම්	**10**	12,118,336		
ස්ථාවර හා භාණ්ඩාගාර බිල් පොළී		102,516,380		
භාණ්ඩාගාර ලැබීම් ආදායමට හඳුනා ගැනීම		15,643,055		
224 ගොඩනැගිලි කුලී		5,424,000		
චිත්‍රාගාරයේ පිටස්තර රූගත කිරීම්		1,958,947		
විදේශීය වාර්තාමය චිත්‍රපට සඳහා අනුමැතිය		3,264,500		
ජනාධිපති සිනමා උළෙල සඳහා ලැබීම්		7,954,000		
			148,879,219	91,924,679
වසරේ ලාභය /අලාභය			20,969,521	(66,806,399)
<u>එකතු කළා : භාණ්ඩාගාර ලැබීම්</u>			109,386,000	97,495,000
බදු පෙර ලාභය			130,355,521	30,688,601
<u>අඩු කළා :</u> බදු සඳහා වෙන් කිරීම්				
ඌනතාවය / අතිරික්තය		.	130,355,521	30,688,601

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2023 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

	සටහන	2023	2022
නියෝජනය වන්නේ		රු.	රු.
ස්ථාවර වත්කම්			
දේපල , යන්ත්‍ර සූත්‍ර හා උපකරණ	11	312,384,692	366,257,801
අස්පෘශ්‍ය වත්කම් :ක්ෂය අඩු කල පසු*	11A	696,840	1,194,230
නොනිමි කාර්යයන්	11B	37,822,933	-
දිගු කාලීන ආයෝජන	12	127,000	141,814,000
සේවක ණය	16-1	18,878,755	17,804,373
		369,910,219	527,070,404
ජංගම වත්කම්			
කෙටි කාලීන ආයෝජන (මාස 06 සඳහා)	13	291,397,189	82,619,991
තොග	14	6,776,122	7,181,945
ලැබිය යුතු සිනමාහල් ණය	15A	106,603,549	126,592,045
නිෂ්පාදන ණය	15B	15,214,734	10,477,259
විවිධ ණයගැතියෝ	16	276,425,515	258,758,538
තැන්පතු හා ඉදිරි ගෙවීම්	17	4,454,694	4,499,160
මුදල්, බැංකු ශේෂය හා මාස 03 සඳහා කෙටිකාලීන ආයෝජන	18	429,911,657	230,681,670
		1,130,783,460	720,810,609
මුළු වත්කම්		1,500,693,679	1,247,881,012
යෙදවූ ප්‍රාග්ධනය			
අනුදත් ප්‍රාග්ධනය **(පිටු අංක - 03)**		10,000,000	10,000,000
සමුච්චිත ලාභය **(පිටු අංක - 03)**		592,436,730	475,908,546
සංචිත **(පිටු අංක - 03)**		160,731,083	160,732,759
		763,167,813	646,641,305
ජංගම නොවන වගකීම්			
ප්‍රදානයන්	19	146,974,497	112,617,553
සේවක පාඨමාලා සඳහා ලබාදුන් මුදල් නැවත අයකිරීම්	60,000	-
	140,925,219	**91,924,679**

සටහන 10		
ජනාධිපති සිනමා උළෙල සඳහා ලැබීම්	**7,954,000**	-
	148,879,219	**91,924,679**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2023 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය සඳහා සටහන්

සටහන : 11 - ස්ථාවර වත්කම් දේපල , යන්ත්‍ර සූත්‍ර හා උපකරණ

	පිරිවැය	පෙර වර්ෂයේ පිරිවැය වෙනුවෙන් කල ගැලපීම	වර්ෂය තුල එකතු කිරීම්	වර්ෂය තුල ඉවත් කිරීම්	පිරිවැය	සමුච්චිත ක්ෂයවීම්	පෙර වර්ෂයේ ක්ෂය වෙනුවෙන් කල ගැලපීම	වර්ෂය සඳහා ක්ෂයවීම්	සමුච්චිත ක්ෂයවීම්	ශුද්ධ අගය
	2023.01.01				**2023.12.31**	**2023.01.01**				**2023.12.31**
	රු.		රු.	රු.	රු.	රු.		රු.	රු.	රු.
01. සින්නක්කර ඉඩම්	174,343,458	-	-	-	174,343,458	-	-	-	-	174,343,458
02. සින්නක්කර ගොඩනැගිලි	150,748,918	3,969,382	111,557	-	154,829,858	85,653,671	(333,108)	5,740,682	91,061,244	63,768,613
03. සිනමා සංකීර්ණය	123,513,361	-	9,148,930	-	132,662,291	94,049,784		6,026,277	100,076,061	32,586,230
04. මිනි සිනමා උපකරණ	331,451	-	-	-	331,451	331,449		-	331,449	2
05. ලී බඩු , සවි කිරීම් හා වැඩිදියුණු කිරීම්	23,449,913	82,965	307,665	-	23,840,543	19,560,099	63,836	779,551	20,403,486	3,437,058
06. කාර්යාලීය උපකරණ	29,836,003	(82,965)	268,750		30,021,788	23,045,702	(63,842)	1,331,882	24,313,743	5,708,046
07. මෝටර් රථ	40,051,450		-	-	40,051,450	10,013,948		10,012,500	20,026,448	20,025,002
08. චිත්‍රපට සංරක්ෂණය	2,104,455		-	-	2,104,455	1,971,133		133,321	2,104,454	1
09. පාපැදි	18,281		-	-	18,281	18,277		-	18,277	4
10. චිත්‍රපට උපකරණ	910,689		-	-	910,689	910,669		-	910,669	20
11. ප්‍රක්ෂේපණ උපකරණ	1,364,052	1,645,000	-	-	3,009,052	882,176		252,885	1,135,061	1,873,991
12. චිත්‍රාගාර යන්ත්‍ර සූත්‍ර	106,062,371	-	-	-	106,062,371	94,036,086		1,922,580	95,958,666	10,103,706
13. සිනමා අධ්‍යාපන උපකරණ	2,234,250	-	56,925	-	2,291,175	1,528,212		229,118	1,757,330	533,846
14. සුභසාධන උපකරන	210,677	-	-	-	210,677	204,389		1,572	205,961	4,716
	655,179,330	**5,614,382**	**9,893,827**	**-**	**670,687,539**	**332,205,596**	**(333,114)**	**26,430,366**	**358,302,848**	**312,384,692**
11A අස්පෘශ්‍ය										
අස්පෘශ්‍ය වත්කම්	2,486,950		-		2,486,950	1,292,720		497,390	1,790,110	696,840
	2,486,950	**-**	**-**	**-**	**2,486,950**	**1,292,720**	**-**	**497,390**	**1,790,110**	**696,840**
11B නොනිමි කාර්ය	(සටහන 2.4)									
1 ගොඩනැගිලි	18,804,857	(4,136,138)		1,324,997	13,343,722	-	-	-	-	13,343,722
2 කාර්යාල උපකරණ	-	-			-	-	-	-	-	-
3 වායු සමීකරණ	7,149,211	**0**			7,149,211	-	-	-	-	7,149,211
4 අස්පෘශ්‍ය වත්කම්	17,330,000				17,330,000	-	-	-	-	17,330,000
	43,284,067	**(4,136,138)**	**-**	**1,324,997**	**37,822,933**	**-**	**-**	**-**	**-**	**37,822,933**
මුළු වත්කම්	**700,950,347**	**1,478,245**	**9,893,827**	**1,324,997**	**710,997,422**	**333,498,316**	**(333,114)**	**26,927,756**	**360,092,958**	**350,904,464**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2023 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය සඳහා සටහන්

		2023	2022
		රු.	රු.
සටහන : 12			
දිගු කාලීන ආයෝජන			
ස්ථාවර තැන්පතු		-	141,687,000
කොටස් ආයෝජනය-සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම		127,000	127,000
(සටහන 2.2.8)		127,000	141,814,000
සටහන : 13			
කෙටි කාලීන ආයෝජන			
ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ තැන්පතු සේවක		5,000	5,000
රිපෝ තැන්පතු		-	-
භාණ්ඩාගාර බිල්පත්		291,392,189	82,614,991
		291,397,189	82,619,991
සටහන : 14			
තොග			
චිත්‍රපට		5,253,887	5,253,887
වෙළඳ කටයුතු		4,596,811	5,203,343
චිත්‍රාගාරය		1,697,363	1,697,363
චිත්‍රාගාරය නවත්තු අමතර කොටස්		1,472,575	1,472,575
ලිපි ද්‍රව්‍යය හා වෙනත්		2,352,662	2,151,953
		15,373,298	15,779,121
සෙමින් අලෙවි වන සහ අලෙවි නොවන තොග සඳහා වෙන් කිරීම්		(8,597,176)	(8,597,176)
		6,776,122	7,181,945
සටහන : 15A			
ණයගැතියෝ			
සිනමාහල්	389,961,317.73		
(-) අධිභාර වෙන් කිරීම	(161,210,579.81)		
(-) ණයගැතියන් සඳහා හානිකරණ ගැලපීම **(සටහන 16 ඒ)**	(122,147,189.39)	106,603,549	126,592,045
සටහන : 15B			
නිෂ්පාදකයෝ	88,503,919.54		
(-) නිෂ්පාදන ණය පොලී වෙන් කිරීම	(4,618,805.70)		
(-) ණයගැතියන් සඳහා හානිකරණ ගැලපීම (සටහන 16 ඒ)	(68,670,379.57)	15,214,734	10,477,259
		121,818,283	137,069,304
සටහන : 16			
විවිධ ණයගැතියෝ			
වෙනත්			
ලැබිය යුතු කොමිස් මුදල් - චිත්මා මණ්ඩලය		248,044,744	198,699,363
ලැබිය යුතු පොලී (ස්ථාවර / රිපෝ)		-	22,047,838
ලැබිය යුතු සංස්ථා භාරය - චිත්මා මණ්ඩලය		30,755,284	25,942,686
ලැබිය යුතු මුදල් ගිණුම 224		6,653,848	20,759,870
විවිධ ණයගැතියෝ සඳහා හානිකරන ගැලපීම (සටහන 16 ඒ)		(14,272,694)	(13,372,488)
සේවක ණය වත්කම් ගිණුම		2,848,384	-
සේවක වැටුප් හා වේතන පාලන ගිණුම		1,797,498	1,830,870
මාස 12 ක් ඇතුලත ලැබිය යුතු සේවක ණය		598,450	2,850,400
		276,425,515	258,758,538
සටහන : 16 -1			
මාස 12කට වැඩි කාලයකදී අය වීමට ඇති සේවක ණය		18,878,755	17,804,373

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2023 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය සඳහා සටහන්

අඩමාන ණය සඳහා වෙන් කිරීම් උපලේඛනය

සටහන : 16 ඒ

ණයගැතියෝ	එකතුව 2023	එකඟ නොවූ හා අය කර ගත නොහැකි	අය කර ගත හැකි	5% වෙන් කිරීම	මුළු වෙන් කිරීම
	රු.	රු.	රු.	රු.	රු.
සිනමාහල්	389,961,318	108,051,709	281,909,609	14,095,480	122,147,189
නිෂ්පාදකයන්	88,503,920	67,626,509	20,877,411	1,043,871	68,670,380
වෙනත්	285,453,877		285,453,877	14,272,694	14,272,694
සේවක ණය	19,477,205	-	19,477,205	-	-
	783,396,319	**175,678,218**	**607,718,101**	**29,412,045**	**205,090,263**

		සිනමාහල්	නිෂ්පාදකයන්	වෙනත්
ශේෂය ඉ / ගෙ	205,026,677	123,233,150	68,421,039	13,372,488
ලාභාලාභ ගිණුමට මාරු කළා	63,585.78	(1,085,961)	249,341	900,206
	205,090,263	**122,147,189**	**68,670,380**	**14,272,694**

ණයගැතියන් සඳහා හානිකරන ගැලපීම

2023.01.01 දිනට	205,026,677
ලාභාලාභ ගිණුමට මාරු කළා	63,586
ශේෂය ප/ගෙ 2023.12.31	**205,090,263**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

2023 දෙසැම්බර් 31 දිනට

මූල්‍ය තත්ත්වය සඳහා සටහන්

	2023	2022
	රු.	රු.
සටහන : 17		
තැන්පතු හා ඉදිරියට ගෙවීම්		
තැන්පතු	3,373,618	4,653,854
අත්තිකාරම් ගෙවීම්	1,024,576	499,034
සුබ සාධක සංගමයට මරණාධාර අත්තිකාරම්	70,000	-
	4,468,194	5,152,888
ණය සඳහා හානිකරන ගැලපීම	(13,500)	(653,728)
	4,454,694	4,499,160
සටහන : 18		
මුදල් හා බැංකු ශේෂ		
මහජන බැංකුව - ජ. ගි. අ. 004-1-001-1-0208647	3,206,242	588,542
මහජන බැංකුව - ජ. ගි. අ. 055-1-001-5-0667533	270,605	1,690,173
මහජන බැංකුව - ජ. ගි. අ. 004-1-001-6-0208664	19,376,623	5,585,038
ලංකා බැංකුව - ජ. ගි. අ. 0002323272	6,206,832	1,670,951
ලංකා බැංකුව - ජ. ගි. අ. 0002323131	906,769	936,902
ලංකා බැංකුව - ජ. ගි. අ. 0002323354	70,424,182	34,981,111
ලංකා බැංකුව - ජ. ගි. අ. 0002323363	35,786,312	12,701,701
ලංකා බැංකුව - ජ. ගි. අ. 0005002189	116,591	3,370,426
ලංකා බැංකුව - ජ. ගි. අ. 5152460	-	-
	136,294,155	61,524,844
අත ඉතිරි මුදල්	420	34
මාස 03ට කල් පිරෙන තැන්පතු		
රිපෝ තැන්පතු	-	-
භාණ්ඩාගාර බිල්පත්	293,617,082	20,800,938
ස්ථාවර තැන්පතු	-	148,355,855
	293,617,082	169,156,793
එකතුව	429,911,657	230,681,670
සටහන : 19		
ප්‍රදානයන්		
භාණ්ඩාගාර ප්‍රදානයන්	152,417,553	114,731,345
(-)ක්‍රමක්ෂය	(12,243,055)	(12,313,792)
	140,174,497	102,417,553
මෝටර් රථ ප්‍රදානයන්	10,200,000	13,600,000
(-)ක්‍රමක්ෂය	(3,400,000)	(3,400,000)
	6,800,000	10,200,000
එකතුව	146,974,497	112,617,553

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2023 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය සඳහා සටහන්

		2023	2022
		රු.	රු.
සටහන : 20			
පාරිතෝෂික වෙන් කිරීම්			
ඉදිරියට ගෙනා ශේෂය - 2023.01.01		48,934,784	49,002,597
2023 ට පෙර ගැලපීම්		1,934,166	660,280
වර්ෂය සඳහා වෙන් කිරීම්		1,907,458	2,009,657
මුදල් ගෙවීම්		(6,341,446)	(2,737,750)
		46,434,961	**48,934,784**
සටහන : 20-1			
ඉදිරි මාස 12න් පසු ගෙවීම්		45,504,001	44,214,794
සටහන : 20-2			
ඉදිරි මාස 12 තුල ගෙවීම් (2023.12.31 දක්වා)		930,960	4,719,990
සටහන : 21			
තැන්පතු			
එන්.එෆ්.සී. සිනමාශාලා ඇප තැන්පතු		451,272	475,272
ආපනශාලා තැන්පතු		-	30,000
ආරක්ෂක තැන්පතු -	සිනමාශාලා	584,238	2,326,727
	සේවක	5,000	5,000
	චිත්‍රපට ආනයන	10,000	7,500
	සිනමා ව්‍යාපෘතිය	-	45,000
	සනිපාරක්ෂක සේවා	160,000	160,000
	ටෙන්ඩර් තැන්පතු	124,000	-
		1,334,510	**3,049,499**
සටහන : 22			
චිත්‍රපට කුලී ණයහිමියෝ			
චිත්‍රපට කුලී ණයහිමියෝ		406,661,704	330,280,811
(-) ණයහිමියන් සඳහා හානිකරන ගැලපීම		-	(18,046,804)
		406,661,704	**312,234,007**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
2023 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය සඳහා සටහන්

	2023	2022
සටහන : 23	රු.	රු.
මූල්‍ය වගකීම්		
උපචිත වියදම් (සටහන් අංක 2.10)	45,723,159	44,917,713
	45,723,159	**44,917,713**

සටහන : 24

වෙනත් ණයහිමියෝ

	2023	2022
ගෙවිය යුතු එකතු කල අගය මත බදු	-	152,612
විගණන ගාස්තු ප්‍රතිපාදන	3,200,000	2,200,000
දේශීය ආදායම් කොමසාරිස් (මුද්දර)	15,798	30,673
හිමිකම් නොපැවේතන	923,683	539,152
සේවක අර්ථසාධක අරමුදල	591,842	591,842
සේවක භාරකාර අරමුදල	70,375	70,375
විවිධ ණයහිමියෝ	95,495	759,734
(-) නොගෙවිය යුතු වගකීම් සඳහා වෙන් කිරීම්	-	(644,840)
ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදල (සටහන් අංක 2.11)	3,525,795	3,525,795
රිත්මා මණ්ඩල පාලන ගිණුම	11,932,180	35,504,261
උපයන විට බදු ගෙවීම	38,253	38,253
වැටුප් හා වේතන වෙන් කිරීමේ ගිණුම	-	577,190
ප්‍රසිද්ධ රැගුම් පාලක මණ්ඩලය	114,801	114,801
ඉදිරි වර්ෂය සඳහා භාණ්ඩාගාර බිල්පත් පොලි	21,064,126	-
සිලොන් බිස්කට් සමාගම	976,303	976,303
ජාතික චිත්‍රපට උළෙල සඳහා වෙන්කිරීම	45,000,000	35,000,000
ජාතික චිත්‍රපට උළෙල සඳහා වෙන්කිරීම	-	50,000
සේවක ණය වගකීම් ගිණුම	2,848,384	-
	90,397,035	**79,486,152**

__අධ්‍යක්ෂ මණ්ඩලය - 2023__

අනු අංකය	නම	තනතුර	ලිපිනය
1	නීතිඥ පී.එම්. දිපාල් චන්ද්‍රරත්න මහතා (2022.08.08 සිට)	සභාපති, ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව	ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව, අංක.303, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.
2	දිනිත් චින්තක කරුණාරත්න මහතා (2022.09.15 සිට)	රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් - රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව	රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, කොළඹ 05.
3	නලින් කුමාර නිශ්ශංක මහතා (2022.08.10 සිට 2023.10.31 දක්වා)	අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව	ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව, කොළඹ 07.
	පී.යූ.වී. වරුසවිතාන මිය (2023.11.21 සිට)	අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව	ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව, කොළඹ 07.
4	භාගයා සී. කටුදෙනිය මිය. (2023.02.28 සිට 2023.07.15 දක්වා)	සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂක - සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව	සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 08 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
	වයි.අයි.ඩී. ගුණවර්ධන මිය (2023.08.29 සිට)		
5	ජනාධිපති නීතිඥ ජගත් වික්‍රමනායක මහතා (2022.10.14 සිට)	ජනාධිපති නීතිඥ	1174, ධම්මෝදය මාවත, බත්තරමුල්ල.
6	ඇෂ්ලි රත්නවිභූෂණ මහතා (2022.08.08 සිට)	සිනමා ක්ෂේත්‍රය නියෝජනය	118, දෙහිවල, බොරලැස්ගමුව.
7	නදිකා ගුණසේකර (2022.08.08 සිට)	සිනමා ක්ෂේත්‍රය නියෝජනය	නො.552 බී, වෙස්ට්බරි පාර්ක්, විජේසිංහ මාවත, පැලවත්ත, බත්තරමුල්ල.
8	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සමන්ත හේරත් (2023.03.15 සිට)	අංශ ප්‍රධානී, සංනිවේදන හා නිර්මාණාත්මක කලා අංශය, කලාපීඨය, කොළඹ විශ්ව විද්‍යාලය	සංනිවේදන හා නිර්මාණාත්මක කලා අංශය, කලාපීඨය - කොළඹ විශ්ව විද්‍යාලය තැ.පෙ. 1490, කොළඹ 03.
9	ආචාර්ය උදිත ගුණසේකර (2023.03.15 සිට)	මානව ශාස්ත්‍ර පීඨය, කැළණිය විශ්ව විද්‍යාලය	කැළණිය විශ්ව විද්‍යාලය, දළුගම, කැළණිය.
10	පී.පී.එස්.ආර්. ද සිල්වා මහතා (2022.11.09 සිට 2023.09.18 දක්වා)	අධ්‍යක්ෂ, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව(භාණ්ඩාගාර නියෝජිත)	විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, මහ ලේකම් කාර්යාලය (3 වන මහල), කොළඹ 01.
	ඩී.පී.ජී. ප්‍රදීප් මහතා (2023.09.18 සිට)	අධ්‍යක්ෂ, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව(භාණ්ඩාගාර නියෝජිත)	විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, මහ ලේකම් කාර්යාලය (3 වන මහල), කොළඹ 01.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. CAA/D/SNFC/1/2023/69 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2024 ඔක්තෝබර් 09 දින

සභාපති
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 10 හි ඡේද 03 හා 08 ඡේද ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන වාර්තා කරන දිනය හා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හිමිවන දින අතරතුර කාලයේදී, මූල්‍ය ප්‍රකාශන වාර්තා කරන දිනට පැවති තත්ත්වය පිළිබඳව සාක්ෂි සපයන ගනුදෙනු මූල්‍ය ප්‍රකාශනවල ගැලපිය යුතු වුවද, පහත සඳහන් ගනුදෙනු මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි.

(i) 2023 දෙසැම්බර් 13 දින සමථයකට පත්ව තිබුණු හිටපු සහකාර සාමාන්‍යාධිකාරී (ගෙවීම්) විසින් සංස්ථාවට එරෙහිව පැවරූ නඩුවේ තීරණයට අනුව ගෙවිය යුතු රු. 1,255,225 ක වන්දි මුදල ගෙවීමට 2024 ජනවාරි 02 දින පැවති 1218 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී අනුමතිය ලබාදී තිබුණද ප්‍රමිතය ප්‍රකාරව එම ගෙවිය යුතු වන්දි මුදල මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි.

(ii) සිනමා ශාලා හිමිකරුවෙකු විසින් 1999 සැප්තැම්බර් 07 දින කලුතර දිසා අධිකරණයේ ගොනුකර තිබුණු නඩුවකට අදාළව 2024 මාර්තු 03 දින ලබාදී තිබුණු තීන්දුව අනුව සිනමාශාලා හිමිකරුට ගෙවිය යුතු රු. 1,131,619 ක වන්දි මුදල සඳහා 2024 අප්‍රේල් 26 දින අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණද ප්‍රමිතය ප්‍රකාරව එම වන්දි මුදල මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2023 දෙසැම්බර් 31 දිනට විවිධ අධිකරණ වල තවදුරටත් විභාග වෙමින් පැවති, සංස්ථාව විත්තිකරු වූ හා බාහිර පාර්ශවයන් විසින් සංස්ථාවට එරෙහිව පනවා ඇති අධිකරණ නඩු කටයුතු 12 ක්ද, කම්කරු පැමිණිලි 02 ක්ද, මානව හිමිකම් කොමිෂන් සභා කාර්යාලයේ ගොණු කර පැවති පැමිණිලි 08 ක්ද, ඇතුළු නඩු 22 කට අදාළ අසම්භාව්‍යතා සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 37 ප්‍රකාරව හෙළිදරව් කිරීම් සිදු කර නොතිබුණි.

(ඇ) චිත්‍රපට සංස්ථාව සතු අංක 224/1 දරන ස්ථානයේ ප්‍රසිද්ධ රැඟුම්පාලක මණ්ඩලය විසින් ඉදිකර තිබුණු දෙමහල් ගොඩනැගිල්ලේ වටිනාකම තක්සේරු කර දේපල පිරියත උපකරණ යටතේ ගිණුම් ගත කර නොතිබුණි. තවද ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය වෙත බදු දී තිබූ මෙම ගොඩනැගිල්ලට අදාල බදු ගිවිසුමට අනුව 2019 සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා ලැබිය යුතු ආදායම රු.24,950,000 ක් වුවත් බදු ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව බදු ගැනුම්කරු විසින් ඉදි කරන ලද ගොඩනැගිල්ල සඳහා වැය වූ මුදල පියවා ගැනීමට වසර 15 ක උපරිමයට යටත්ව මාසික බදු කුලියෙන් සියයට 80 ක මුදලක් හිලව් කළ යුතු බවට

පහත වී තිබීම හේතුවෙන් බදු ගැනුම්කරු විසින් ගෙවන ලද සියයට 20 ක මුදල පමණක් ආදායම ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ ආදායම රු. 4.320.000 කින් හා සමුච්චිත ලාභය රු. 15.640.000 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සේවක ණය උපලේඛනයේ පැරණි ශේෂ ලෙස දක්වා ඇති රු.539.222 ක් වූ හඳුනාගත නොහැකි ශේෂයන්ට අදාළ විස්තරාත්මක තොරතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එම ශේෂයන්ගේ නිරවද්‍යතාවය විගණනයේදී තහවුරු කළ නොහැකි විය.

(ඉ) 2023 දෙසැම්බර් 31 දිනට සිසුන් 36 දෙනෙකු ගෙන් අයවිය යුතු රු. 1.110.000 ක් වූ සිනමාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා ගාස්තුව සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් වර්ෂයේ ආදායම හා ලැබිය යුතු ආදායම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) සේවක අර්ථසාධක අරමුදලේ රු.591,842 ක්ද සේවක භාරකාර අරමුදලේ රු.70.375 ක්ද වශයෙන් එකතුව රු. 662,217 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් යටතේ වෙනත් ණයගිමියෝ ලෙස ගිණුම්ගත කර තිබුණද, එම ශේෂයන් තහවුරු කිරීම සඳහා සාක්ෂි නොවිය.

(උ) මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනයේ වෙනත් ණයගිමියෝ යටතේ විද්‍යා මණ්ඩල පාලන ගිණුම ලෙස රු.11,932,180 ක් දක්වා තිබුණද ඊට අදාල සනාථන විගණනයට ඉදිරිපත් නොවූයෙන් එහි නිවැරදිතාවය පරීක්ෂා කිරීමට විගණනයට නොහැකිවිය.

(ඌ) ඉදිරි ගෙවීම් ගිණුම් ශේෂය තුල ඇතුළත් 2022 හා 2023 වර්ෂයන්ට අදාළ 2021 හා 2022 වර්ෂවලදී ගෙවන ලද රු. 484.033 ක් ඒ ඒ වර්ෂවලදී ගිණුම්වල ගැලපීම් කර නොතිබීම හේතුවෙන් වර්ෂයේ ලාභය රු. 396.590 කින්ද පෙර වර්ෂයේ ලාභය රු. 87.443 කින්ද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් රු. 484.033 කින්ද වැඩියෙන් දක්වා තිබුණි.

(ඍ) 2020 වර්ෂයේදී කැලණිය සරසවි චිත්‍රාගාරයේ නාම පුවරුවක් සවි කිරීමට අදාළ ඇණවුම් වටිනාකම වන රු.450,000 ක මුදල නොනිමි වැඩ ගිණුමට හර කර උපචිත වියදම් ගිණුමට බැර කර තිබූ අතර 2023 වර්ෂයේදී එම ඇණවුම අවලංගු කිරීම මත අදාළ වටිනාකම නොනිමි වැඩ ගිණුමෙන් ඉවත් කර ගොඩනැගිලි ගිණුමට ද, උපචිත වියදම් ගිණුමෙන් ඉවත් කර පෙර වර්ෂ ලාභාලාභ ගිණුමට ගිණුම්ගත කිරීම හේතුවෙන් ගොඩනැගිලි වටිනාකම රු.450.000 කින් ද, සමුච්චිත ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් ද දක්වා තිබුණි. තවද ඒ මත රු. 112.500 ක ක්ෂය වෙන් කිරීමද සිදු කර තිබීමෙන් වර්ෂයේ ක්ෂය හා ක්ෂය වෙන් කිරීමේ ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඒ) විගණනයට ඉදිරිපත් කරන ලද විස්තරාත්මක උපලේඛනය අනුව 2023 දෙසැම්බර් 31 දිනට සිනමාශාලා ණයගැති ශේෂය රු. 418,123,560 ක් වුවද එදිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව එම ශේෂය රු.389,961,318 ක් වූයෙන් එම ශේෂ අතර රු.28,162,242 ක වෙනසක් නිරීක් ෂණය විය.

(ඔ) විගණනයට ඉදිරිපත් කළ උපලේඛනය අනුව 2023 දෙසැම්බර් 31 දිනට ණයහිමි ශේෂය රු.445,402,401 ක් වුවද එදිනට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය රු. 406,661,704 ක් වූයෙන් රු.38,740,697 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඕ) චිත්‍රපට ආනයනය,බෙදාහැරීම හා ලියාපදිංචිය විධිමත් කිරීමට අදාළ පරිගණක පද්ධතිය ස්ථාපිත කිරීමේ කොන්ත්‍රාත්තුවට අදාළව 2021 වර්ෂයේදී ගෙවන ලද වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් රු.3,380,000 ක් ද, පළමු ගෙවීම රු.3,943,333 ක් සහ වැඩ සහතිකයක් ලබා ගැනීමකින් තොරව උපචිත වියදම් ලෙස ගිණුම්ගත කළ රු.9,576,667 ක් ද ඇතුළු රු.16,900,000 ක් වූ ගිවිසුම්ගත මුළු මුදලම නොනිමි වැඩ ගිණුමට ගිණුම්ගත කර තිබීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට රු.5,070,000 ක් වූ එහි කළවැඩ වටිනාකම රු .11,830,000 කින් වැඩියෙන් ද නොනිමි වැඩ ගිණුමේ දක්වා තිබුණි. වැඩ සහතික කිරීමකින් තොරව උපචිත වියදම් ලෙස හඳුනා නොගත යුතු වුවත් සංස්ථාව විසින් වැඩ සහතික නොකළ රු.9,576,667 ක් උපචිත වියදම් ලෙස හඳුනා ගෙන තිබුණු අතර අයවිය යුතු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ශේෂය වූ රු.2,253,333 ක් අත්තිකාරම් ගිණුමක වෙනම දක්වා නොතිබුණි.

(ක) 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සංස්ථාව වෙත මුදලින් ලද ස්ථාවර තැන්පතු හා භාණ්ඩාගාර බිල්පත් පොළී ආදායම රු.92,237,740 ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය යටතේ එම ආදායම රු.102,516,380 ක් ලෙස රු.10,278,640 ක් වැඩියෙන් දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සංස්ථාවේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සංස්ථාවේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සංස්ථාවේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් නිර්ණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව නිර්ණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තිය විනිශ්චය සහ වෘත්තිය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව

ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම් කොටසේ 1.2 (ඇ). (ඉ). (ඊ) සහ (උ) ඡේදයන්වල දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
(අ) 1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනත	
i. 4 (උ) වගන්තිය	ශ්‍රී ලංකාවෙහි නිපදවනු ලබන චිත්‍රපට සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත ඉල්ලුම සහ චිත්‍රපට වෙළඳාම ප්‍රවර්ධනය කිරීම සඳහා සංස්ථාව ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.
ii. 4 (ඌ) වගන්තිය	ශ්‍රී ලංකාව තුළ සහ ශ්‍රී ලංකාවෙන් පිටත චිත්‍රපට සම්බන්ධයෙන් වෙළඳපොළ පර්යේෂණ පැවැත්වීමට කටයුතු කර නොතිබුණි .
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ	
i. මුදල් රෙගුලාසි 177(1)	දෛනිකව ලැබෙන මුදල් දිනපතා හෝ හැකි ඉක්මනින් බැංකුගත කළ යුතු වුවද ජංගම ගිණුමකට අදාලව 2023 අප්‍රේල් සිට දෙසැම්බර් 31 දින දක්වා ලැබී තිබුණු රු.747,638 ක මුදල් ශේෂය දින 01 සිට මාස 03 දක්වා කාලයක් ඵන රඳවාගෙන බැංකුගත කර තිබුණි.
ii. මුදල් රෙගුලාසි 540	දිනපතා ගනුදෙනු අවසානයේ දී මුදල් වල හරිවැරදි බැලීම සිදු කර නොතිබුණු අතර දෛනිකව ඵන ඉතිරි මුදල් වල හා බැංකුගත කිරීම් පිළිබඳ නිවැරදිතාවය වගකිව යුතු නිලධාරීන් විසින් තහවුරු කර නොතිබුණි.

(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ	
	II පරිච්ඡේදයේ 15:1 (ix) වගන්තිය හා 2012 සැප්තැම්බර් 14 දිනැති සංස්ථාවේ අනුමත බඳවා ගැනීමේ පරිපාටිය	නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීම සඳහා පත් කිරීම් බලධරයා ද, දෙපාර්තමේන්තු ප්‍රධානියා ද, සම වගකීමට බැඳෙන අතර බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කළ 2012 සැප්තැම්බර් 14 දින සිට මේ දක්වා කිසිදු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කර නොතිබුණි.
(ඇ)	2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021න් ප්‍රකාශිත මෙහෙයුම් අත්පොතේ 6.6 වගන්තිය	මූල්‍ය වර්ෂය අවසන් වී මාස 05 ක් ඇතුළත වාර්ෂික වාර්තා අදාළ කාර්යසාධන වාර්තාවද සමගින් පාර්ලිමේන්තුව තුළ සභාගත කළ යුතු වුවද, සංස්ථාවේ 2022 වර්ෂය වෙනුවෙන් වූ වාර්ෂික වාර්තාව 2024 සැප්තැම්බර් 30 දින වන විටත්, සභාගත කර නොතිබුණි.
(ඉ)	2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 න් ප්‍රකාශිත රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ යහපාලන මගපෙන්වීම් සංග්‍රහයේ 2.3 ඡේදය	සංස්ථාව සඳහා උපාය මාර්ගික සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ල) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ළ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 ඡේදය ප්‍රකාරව රු.500,000 ඉක්මවන භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනයේදී විධිමත් ලිඛිත ගිවිසුමකට එළඹිය යුතු වුවත්, රු.800,650 ක් වූ දෛනික වාර්තා පොත් 670 ක් මිලදී ගැනීමට අදාළව ලිඛිත ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ආ) දෛනික වාර්තා පොත් 1000 ක් මුද්‍රණය කිරීම සඳහා අවස්ථා 02 කදී රු.1,267,435 ක වියදමක් දරා තිබුණද රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.1 ඡේදය ප්‍රකාරව තාක්ෂණික ඇගයීම් කමිටුවක් විසින් ලංසු ඇගයීමට ලක් කර නොතිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) ආයතනයක අරමුණු ඉටුකර ගැනීම සඳහා ප්‍රශස්ථ කාර්ය මණ්ඩලයක් පැවතීම අනිවාර්ය වන අතර කාර්ය මණ්ඩල ඌනතා පැවතීම එම ආයතනයේ කාර්යක්ෂමතාවයට හානිදායි විය හැකිවන අතර කාර්යය මණ්ඩල පුරප්පාඩුවීම් පැවතීම සංස්ථාවේ මෙහෙයුම් කටයුතු ඵලදායීව ක්‍රියාත්මක කර සිදුකරගෙන යාමට සෘජුවම බලපා තිබියදීත්, ඒ පිළිබඳ අවධානය යොමු නොකර සංවර්ධන සහකාර නිළධාරීන් 04 දෙනෙකු ජනාධිපති ලේකම් කාර්යාලය වෙත 'මුදාහැර 2022 'අගොස්තු 18 දින සිට දින 2024 මැයි දක්වා වැටුප් හා දීමනා ලෙස රු. 4,952,766 ක මුදලක් ගෙවා තිබුණු අතර 2024 අගෝස්තු වන විටත් ගෙවන ලද එම වැටුප් හා දීමනා ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වසර 05 කට පෙර සිට පැවත එන සංස්ථාවේ සුබසාධක සංගමයෙන් ලැබිය යුතු රු. 354,000 ක් හා ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදලෙන් ප්‍රදර්ශිත චිත්‍රපට වෙනුවෙන් ලැබිය යුතු රු.1,360,404 ක් අයකරගත නොහැකි ශේෂය තුල දක්වා තිබූ අතර සංස්ථාවේ අභ්‍යන්තර අංශ අතර සිදු වූ ගනුදෙනු මත ඇතිව තිබූ මෙම ලැබිය යුතු ශේෂයන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2023 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 870,659 ක් වූ දළ සේයාපට සහ රසායනාගාර ද්‍රව්‍ය තොගය 2014 වර්ෂයේ සිට කාලය ඉකුත්වීම සහ වර්තමානයේ භාවිතා නොකිරීම නිසා ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයක පැවති අතර පූර්ව වර්ෂ විගණකාධිපති වාර්තාව මඟින්ද පෙන්වා දී තිබුණද, මෙම නිෂ්කාර්ය වත්කම අපහරණය කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) 2023 දෙසැම්බර් 31 දිනට චිත්‍රපට නිෂ්පාදනයට සහ සිනමාශාලා සඳහා ලබාදී ඇති ණය මුදල් වලින් එකතුව රු. 88,503,920 ක් සහ සිනමාශාලා වලින් සංස්ථාවට ලැබිය යුතු හිඟ මුදල් එකතුව රු. 389,961,318 ක් ඇතුළුව එකතුව රු. 478,465,238 ක මුදලක් සංස්ථාව වෙත ලැබිය යුතුව තිබුණි. එම මුළු ලැබිය යුතු මුදලින් එකතුව රු.356,646,954 ක් අධිභාර සහ හානිකරණ ගැලපීම නිසා 2023 දෙසැම්බර් 31 දිනට අයකරගත හැකි ශුද්ධ ණය ශේෂය රු.121,818,284 ක් එනම් මුළු ණයගැතියන්ගෙන් සියයට 25.46 ක් විය. කළමනාකරණය විසින් ණය අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග නොගැනීම මත මෙම ණය අයකරගත නොහැකිව තිබුණි.

(ඉ) ආචාර්ය "ලෙස්ටර් ජේම්ස් පීරිස්" මහතා නාමීන් සංස්ථා පරිශ්‍රය තුළ කෞතුකාගාරයක් සහ පුස්තකාලයක් ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත එකතු වටිනාකම රු.99,965,061 කට ඉදිකිරීම් සහ උපදේශනාත්මක කටයුතු රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට පවරා දීමට ද්විපාර්ශවික ගිවිසුමකට එළඹ 2019 අප්‍රේල් 05 දින එහි ඉදිකිරීම් ආරම්භ කර තිබුණි. නාගරික සංවර්ධන අධිකාරියේ සහ අමාත්‍ය මණ්ඩල අනුමැතියක් රහිතව ආරම්භ කළ මෙම ඉදිකිරීම වෙනුවෙන් 2023 දෙසැම්බර් 31 දින වන විට එකතුව රු.3,134,107 ක් ගෙවීම් කර තිබුණි. පූර්ව වර්ෂ විගණකාධිපති වාර්තාව මඟින්ද පෙන්වා දුන් මෙම ඉදිකිරීමේ කටයුතු වසර 05 කට වැඩි කාලයක සිට අතහැර දමා තිබූ අතර, ඉදිකිරීම් ආරම්භ කළ මෙම ගොඩනැගිල්ලේ ඇති යකඩ කූරු දැඩි ලෙස භායනයට ලක්වීම නිසා ගොඩනැගිල්ල විනාශ වෙමින් පැවතුණි.

(ඊ) දේශීය හා විදේශීය චිත්‍රපට බෙදාහැරීමේ කොමිස් මුදල සංස්ථාවේ ප්‍රධාන ආදායම් මූලාශ්‍රයක් වන අතර කාලයක් තිස්සේ පෞද්ගලික ආයතන මඟින්ද චිත්‍රපට බෙදාහැරීම සිදුකර තිබුණි. අංක අමප/21/1024/305/022 හා 2021 ජූනි මස 14 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් චිත්‍රපට බෙදාහැරීම හා ප්‍රදර්ශනයට අදාල ක්‍රමවේදය සංස්ථාවට පවරා ගැනීමට අනුමැතිය ලබාදී තිබුණ ද විගණිත දින වූ 2024 මැයි දක්වා යථෝක්ත කරුණු ගැසට් පත්‍රයක් මඟින් ප්‍රකාශයට පත්කර ක්‍රියාත්මක කිරීමට සංස්ථාවේ ඉහළ කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(උ) 1983 අංක 12 දරන පාරිතෝෂික පනතේ 13 වන වගන්තියට පටහැනිව, හිටපු මාධ්‍ය ප්‍රචාරක නිලධාරී වෙත ගෙවියයුතු රු.1,347,011 ක පාරිතෝෂික මුදල් ගෙවීම සංස්ථාව විසින් ප්‍රතික්ෂේප කර තිබුණු අතර වර්ෂයකට වැඩියෙන් ගෙවීම් ප්‍රමාද වීම හේතුවෙන් පනතේ II වන කොටසේ 4 (1) (ඉ) වගන්තිය ප්‍රකාරව රු. 404,103 ක අධිභාරයක් ගෙවීමට සිදුවී තිබුණු අතර කළමනාකරණ අකාර්යක්ෂමතා හේතුවෙන් අධිභාර ගෙවීම මත සංස්ථාවට අලාභයක් සිදු වී තිබුණි.

(ඍ) 2021 වර්ෂයේ මාර්තු මස ආරම්භ කර ඔක්තෝබර් වන විට නිම කිරීමට සැලසුම් කරමින් රු.මිලියන 15 ක ප්‍රතිපාදනයක් යටතේ 2021 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබූ චිත්‍රපට ආනයනය, බෙදාහැරීම හා ලියාපදිංචිය විධිමත් කිරීමට අදාළ පරිගණක පද්ධතිය ස්ථාපිත කිරීමේ කාර්යය සඳහා දෙපාර්ශවය අතර එළඹී අංක 4820 දරන 2022 අප්‍රේල් 28 දිනැති මුල් ගිවිසුමේ කාලය අවස්ථා 03 කදී දීර්ඝ කර තිබුණද එම කාර්යය 2024 අගෝස්තු 05 දින වන විටත් අවසන් කර නොතිබුණු අතර 2023 හා 2024 වර්ෂවල ක්‍රියාකාරී සැලසුම් තුළ මෙම ක්‍රියාකාරකම ඇතුළත් කර නොතිබුණි. තවද දෙපාර්ශවය අතර එළඹී අංක 4867 දරන අවසාන ගිවිසුමද 2023 ජූලි 23 දින අවසන්ව තිබුණද නව ගිවිසුමකට එළඹීමට ද කටයුතු කර නොතිබුණි.

(එ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සංස්ථාවේ ක්‍රියාකාරී සැලසුමට අනුකූලව කාර්ය සාධනය පිළිබඳ ප්‍රගති වාර්තාව ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් සංස්ථාවේ කාර්ය සාධනය පරීක්ෂා කළ නොහැකි විය.

(ඒ) රාජ්‍ය වියදම් පාලනය කිරීමේ අරමුණින් නිකුත් කරන ලද 2022 නොවැම්බර් 11 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ 08/2022 ප්‍රකාරව සියලුම ආකාරයේ උත්සව පැවැත්වීම වෙනුවෙන් ස්වකීය ආයතනවල ඉඩකඩ භාවිතා කරමින් දරනු ලබන වියදම් නැවැත්විය යුතු වුවද, ජනාධිපති සම්මාන උළෙල පැවැත්වීමෙන් පසු දිනක එම සම්මාන උළෙලට දායක වූ පාර්ශවයන් 45 දෙනෙකු වෙනුවෙන් පෞද්ගලික හෝටලයක පැවති රාත්‍රී භෝජන සංග්‍රහයක් වෙනුවෙන් රු.267,030 ක් වැය කර තිබුණි.

(ඔ) සංස්ථාවේ අභ්‍යන්තර විගණක තනතුර 2021 වර්ෂයේ සිට විගණිත දින දක්වාම පුරප්පාඩුව පැවතුණ අතර ඒ හේතුවෙන් අභ්‍යන්තර විගණන අංශය අක්‍රියව පැවතුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

Printed by : State Printing Corporation